# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2016

# ඇගයීම් වාර්තාව

## 71 - සිංහල

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2016

## ඇගයීම් වාර්තාව

# 71 - සිංහල

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

**පර්යේෂණ හා සංවර්ධන ශාඛාව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.**

සියලු ම හිමිකම් ඇවිරිණි.

**සිංහල**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2016

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගය යි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලයවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන් ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස. (උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන් ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2016 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 211865ක් පාසල් අයදුම්කරුවෝ ද 46328ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමවුපියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකර ගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් සහාය ලබා දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස. (උ.පෙළ) සිංහල විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද සිංහල විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබා ගෙන ඇති ආකාරය සවිස්තරාත්මක ව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස. (උ.පෙළ) 2016 විභාගයේ සිංහල විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබා ගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කර ගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟා වීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රිය ව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා මෙම කාර්යය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2017 දෙසැම්බර් 01 දින
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ/ සංවර්ධන හා ඇගයීම්) |
| **සම්බන්ධීකරණය** | : | බුද්ධිකා පෙරේරා<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | මහාචාර්ය රත්න විජේතුංග<br><br>පූජ්‍ය ආචාර්ය මොරකන්දේගොඩ අරියවංස හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>රුහුණ විශ්ව විද්‍යාලය<br><br>ශ්‍රියානි අබේවික්‍රම<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික) |
| **සැකසුම් කමිටුව** | : | වාසනා පයාගල<br>ගුරු සේවය I<br>කො/ ගෝතමී බාලිකා විද්‍යාලය<br><br>ධම්මික පරාක්‍රම<br>ගුරු සේවය I<br>ක/ විද්‍යාරත්න පිරිවෙන් විද්‍යායතනය, හොරණ<br><br>ආර්. කේ. ඒ. එල්. පද්මසිරි<br>ගුරු උපදේශක (ගුරු සේවය I)<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - නක්කාවත්ත<br><br>එම්. ඒ. රණතුංග<br>ගුරු සේවය I<br>සරසවි උයන මහා විද්‍යාලය, පේරාදෙණිය |
| **පරිගණක පිටපත සැකසුම** | : | පී. මධුශානි මණ්ඩලවත්ත<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය නිර්මාණය** | : | වයි.එස්. අනුරාධි<br>සංවර්ධන නිලධාරි |

## ඇතුළත පිටු


**I කොටස** පිටු අංකය

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 5
1.3.2 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 5
1.3.3 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 6
1.3.4 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 7
1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 7
1.3.6 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8

**II කොටස**

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 10
2.1.2 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු 11
2.1.3 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 31

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 33
2.2.2 II ප්‍රශ්න පත්‍රය - I කොටස 34
2.2.3 II ප්‍රශ්න පත්‍රයේ I කොටස සඳහා අපේක්ෂිත ලකුණු දීමේ පටිපාටිය 36
2.2.4 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 37
2.2.5 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 38
2.2.6 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ (වර්ගීකරණය අනුව) 41
2.2.7 II ප්‍රශ්න පත්‍රයේ II කොටස හා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 43
2.2.8 II ප්‍රශ්න පත්‍රයේ II කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 63

**III කොටස**

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 64
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 66

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂයයෙහි අභිමතාර්ථ

- ලේඛන ව්‍යවහාරය පාදක කොටගෙන මනා අවබෝධයෙන් යුතු ව ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීම
- ලිඛිත ප්‍රකාශන නිරවුල් ව හා අවබෝධයෙන් යුතු ව ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය කිරීම
- ලේඛන ව්‍යවහාරය ආශ්‍රිත ව අක්ෂර, පද, වාක්‍ය හා අර්ථ භාවිතය පිළිබඳ පරිචයක් ඇති කිරීම
- කාලීන සමාජ පරිසරයේ පවත්නා වස්තු හා සිදුවීම් පිළිබඳ නිරවුල් අවබෝධය වර්ධනය කිරීම
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ කුසලතා වර්ධනය කිරීම
- විවිධ මානව චර්යා හා ජීවන වෘත්තීන්ට අදාළ ව ප්‍රායෝගික ව භාෂාව භාවිත කිරීමේ කුසලතා වර්ධනය කිරීම
- සංස්කෘතික දායාද, සාම්ප්‍රදායික ආචාර ධර්ම, ජීවන දෘෂ්ටි, ආකල්ප හා ඇගයීම් පිළිබඳ කුසලතා සිංහල භාෂා සාහිත්‍යය පාදක කොටගෙන වර්ධනය කිරීම
- සාහිත්‍ය නිර්මාණ පරිශීලනය මගින් ලබා ගත් පරිචය හා අද්දැකීම් ආශ්‍රයයෙන් සාහිත්‍ය රසඥතා වර්ධනය හා නිර්මාණකරණය සඳහා යොමු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 48107 | 13279 | 61386 |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 7930 | 16.48 | 1589 | 11.97 | 9519 | 15.51 |
| B | 15662 | 32.56 | 3484 | 26.24 | 19146 | 31.19 |
| C | 15650 | 32.53 | 4532 | 34.13 | 20182 | 32.88 |
| S | 7085 | 14.73 | 2844 | 21.42 | 9929 | 16.17 |
| F | 1780 | 3.70 | 830 | 6.25 | 2610 | 4.25 |
| එකතුව | **48107** | **100.00** | **13279** | **100.00** | **61386** | **100.00** |

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 2419 | 372 | 15.38 | 691 | 28.57 | 789 | 32.62 | 436 | 18.02 | 2288 | 94.58 | 131 | 5.42 |
| 2. ගම්පහ | 3714 | 523 | 14.08 | 1141 | 30.72 | 1264 | 34.03 | 634 | 17.07 | 3562 | 95.91 | 152 | 4.09 |
| 3. කළුතර | 2359 | 442 | 18.74 | 721 | 30.56 | 671 | 28.44 | 402 | 17.04 | 2236 | 94.79 | 123 | 5.21 |
| 4. මහනුවර | 2666 | 314 | 11.78 | 715 | 26.82 | 945 | 35.45 | 548 | 20.56 | 2522 | 94.60 | 144 | 5.40 |
| 5. මාතලේ | 1123 | 99 | 8.82 | 343 | 30.54 | 444 | 39.54 | 171 | 15.23 | 1057 | 94.12 | 66 | 5.88 |
| 6. නුවරඑළිය | 890 | 122 | 13.71 | 262 | 29.44 | 321 | 36.07 | 157 | 17.64 | 862 | 96.85 | 28 | 3.15 |
| 7. ගාල්ල | 2553 | 594 | 23.27 | 773 | 30.28 | 693 | 27.14 | 370 | 14.49 | 2430 | 95.18 | 123 | 4.82 |
| 8. මාතර | 1806 | 330 | 18.27 | 539 | 29.84 | 508 | 28.13 | 305 | 16.89 | 1682 | 93.13 | 124 | 6.87 |
| 9. හම්බන්තොට | 1275 | 211 | 16.55 | 382 | 29.96 | 414 | 32.47 | 195 | 15.29 | 1202 | 94.27 | 73 | 5.73 |
| 10. යාපනය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 11. කිලිනොච්චි | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 12. මන්නාරම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 13. වව්නියාව | 41 | 6 | 14.63 | 13 | 31.71 | 18 | 43.90 | 4 | 9.76 | 41 | 100.00 | 0 | 0.00 |
| 14. මුලතිව් | 7 | 0 | 0.00 | 1 | 14.29 | 5 | 71.43 | 1 | 14.29 | 7 | 100.00 | 0 | 0.00 |
| 15. මඩකලපුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 16. අම්පාර | 835 | 55 | 6.59 | 216 | 25.87 | 337 | 40.36 | 171 | 20.48 | 779 | 93.29 | 56 | 6.71 |
| 17. ත්‍රිකුණාමලය | 202 | 29 | 14.36 | 64 | 31.68 | 65 | 32.18 | 32 | 15.84 | 190 | 94.06 | 12 | 5.94 |
| 18. කුරුණෑගල | 3507 | 441 | 12.57 | 1014 | 28.91 | 1225 | 34.93 | 662 | 18.88 | 3342 | 95.30 | 165 | 4.70 |
| 19. පුත්තලම | 1379 | 225 | 16.32 | 408 | 29.59 | 455 | 32.99 | 235 | 17.04 | 1323 | 95.94 | 56 | 4.06 |
| 20. අනුරාධපුරය | 1917 | 297 | 15.49 | 615 | 32.08 | 607 | 31.66 | 308 | 16.07 | 1827 | 95.31 | 90 | 4.69 |
| 21. පොළොන්නරුව | 748 | 111 | 14.84 | 259 | 34.63 | 251 | 33.56 | 103 | 13.77 | 724 | 96.79 | 24 | 3.21 |
| 22. බදුල්ල | 1746 | 202 | 11.57 | 474 | 27.15 | 660 | 37.80 | 347 | 19.87 | 1683 | 96.39 | 63 | 3.61 |
| 23. මොනරාගල | 1154 | 98 | 8.49 | 332 | 28.77 | 473 | 40.99 | 208 | 18.02 | 1111 | 96.27 | 43 | 3.73 |
| 24. රත්නපුරය | 2276 | 434 | 19.07 | 801 | 35.19 | 654 | 28.73 | 324 | 14.24 | 2213 | 97.23 | 63 | 2.77 |
| 25. කෑගල්ල | 1956 | 215 | 10.99 | 589 | 30.11 | 691 | 35.33 | 377 | 19.27 | 1872 | 95.71 | 84 | 4.29 |
| **සමස්ත දිවයින** | 34573 | 5120 | 14.81 | 10353 | 29.95 | 11490 | 33.23 | 5990 | 17.33 | 32953 | 95.31 | 1620 | 4.69 |

වගුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91-100 | 1 | 0.00 | 61386 | 100.00 |
| 81-90 | 775 | 1.26 | 61385 | 100.00 |
| 71-80 | 11039 | 17.98 | 60610 | 98.74 |
| 61-70 | 20047 | 32.66 | 49571 | 80.75 |
| 51-60 | 15632 | 25.47 | 29524 | 48.10 |
| 41-50 | 8636 | 14.07 | 13892 | 22.63 |
| **31-40** | **3657** | **5.96** | **5256** | **8.56** |
| 21-30 | 1283 | 2.09 | 1599 | 2.60 |
| 11-20 | 223 | 0.36 | 316 | 0.51 |
| 01-10 | 93 | 0.15 | 93 | 0.15 |
| 00-00 | 0 | 0.00 | 0 | 0.00 |

වගුව 4

උදා:- (31 - 40 පංති ප්‍රාන්තරය ගතහොත්)
මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 3657කි. එය ප්‍රතිශතයක් වශයෙන් 5.96%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 5256ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 8.56%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි I ප්‍රශ්නය අනිවාර්ය වුව ද එය තෝරා ගෙන ඇත්තේ 98%ක් පමණි. අඩු ම ප්‍රතිශතයක් තෝරා ගෙන ඇත්තේ 04 වන ප්‍රශ්නය වන අතර එය තෝරා ගෙන ඇත්තේ 13%ක් පමණි.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 40කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 31 - 40 තෙක් ලබා ගත් ප්‍රතිශතය 9%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ, එනම් ලකුණු 00 - 10 තෙක් ලබා ගත් ප්‍රතිශතය 4%කි.

### 1.3.3 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

මෙහි ඉහළ ම පහසුතාව දක්වා ඇත්තේ (ආ) කොටසෙහි (i) අනුකොටසට ය. එය 98%කි. (ආ) කොටසේ (iii) හා (ඉ) කොටසේ (iii) අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් 90%ක් සහ 85%ක් වශයෙන් දැක්විය හැකි ය. අඩු ම පහසුතාව දක්වා ඇත්තේ (ඊ) කොටසෙහි (i) අනුකොටසට ය. එය 5%කි.

### 1.3.4 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි පළමුවන ප්‍රශ්නයේ ප්‍රශ්න 20ක් ඇති අතර, එක් එක් ප්‍රශ්නයකට දී ඇති වරණ පහ අතුරෙන් නිවැරදි වරණය තේරිය යුතු ය. ඒ සඳහා ලකුණ බැගින් ලකුණු 20ක් හිමි වේ. 1, 2 හා 3 ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වන නමුත් එම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ඇත්තේ පිළිවෙළින් 96%, 97% හා 92%ක් වශයෙනි.

### 1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි 1 වන ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 - 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 8%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 00 - 05 තෙක් ලබාගත් ප්‍රතිශතය 5%කි.

### 1.3.6 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4.1 (RD/16/05/AL) පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 1 කොටසෙහි 1.5 වන කොටසෙහි පහසුතාව 98% වේ. අවම පහසුතාව ඇත්තේ 1.6 ප්‍රශ්නයට වන අතර එහි අගය 24%කි.

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2016**
**71 - සිංහල - II පත්‍රය**
**II කොටසේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය**




ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- II කොටසේ 3 ප්‍රශ්නයෙහි (vi) අනුකොටසෙහි පහසුතාව 98% වේ. අඩු ම පහසුතාව දක්වන්නේ 5 වන ප්‍රශ්නයේ (අ) කොටසට යි. එය 26%කි.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- ⋆ කාලය පැය 03කි. මුළු ලකුණු 100කි.
- ⋆ ප්‍රශ්න අටකින් සමන්විත වේ. **පළමු වන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු අතර පිළිතුරු සඳහා වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගත යුතු වේ.
- ⋆ 1 ප්‍රශ්නය කොටස් **හයකින්** සමන්විත වේ. සියලු කොටස්වලට පිළිතුරු සැපයිය යුතු ය. අනෙක් ප්‍රශ්න **හත** අතුරෙන් අභිමත ප්‍රශ්න **හතරක්** තෝරා ගත යුතු වේ.

2.1.2 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු

## 01 ප්‍රශ්නය

- පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**1.** (අ) පටාචාරාවෝ ද සෝවාන්වලා ගිහිගෙයි රඳා හිඳ දුටු සැපයක් ම නැති හෙයින් මහණ කරන්ට ආරාධනා කළහ. බුදුහු උන් මහණ කරන්ට මෙහෙණින්නන් ළඟට යවූ සේක. මෙහෙණින්නෝත් මහණ මාලුපැවිදි කළහ. ආචාර්ය උපාධ්‍යාය තැන් ඇති ව මහලුපැවිද්ද ලත් හෙයින් නැති වූ දෙමවුපියන්ට ශාසනයෙන් දෙමවුපියනුත් ලැබ පටාචාරා ස්ථවිරි යයි ප්‍රසිද්ධ වූහ. එක් දවසක් කළයෙකින් පැන් හැර ගෙන පය සෝධන්නාහු පයට පැන් වත් කළහ. ඒ පැන් බිම මඳ තැනක් ගොසින්ලා බී ගියේ ය. දෙවන දවස් පය සේධූ පැන් ආදී දවස් පැන් ගිය තැන පැන් බී යන්ට මඳ හෙයින් එ පන්වා මඳක් දුරු ව ගොසින්ලා බී ගියේ ය.

(i) පටාචාරා මහණ වන්නට සිතුයේ ඇයි?

(ii) පටාචාරා මෙහෙණියට නැවත දෙමව්පියන් ලැබුණේ කෙසේ ද?

(iii) පටාචාරාවන් දවස් දෙකක දී පයට වත් කළ පැන් බිම බී ගිය ආකාරය පැහැදිලි කරන්න.

(iv) **"මාලුපැවිදි"**, **"බී ගියේ ය"** යන වචනවල තේරුම ලියන්න. (ලකුණු 04 යි.)

(i) ගිහිගෙයි රැඳීමේ සැපතක් නොමැති නිසා.

(ii) සසුන්ගත ව ආචාර්ය උපාධ්‍යාය තැන් ඇති ව මහලු පැවිද්ද ලත් බැවිනි.

(iii) පළමු දිනයේ පය සේදූ පැන් මඳක් දුර ගොස් පොළොවට උරා ගත්තේ ය. දෙවන දිනයේ පය සේදූ පැන් පෙර දිනයේ පැන් ගලා ගිය දුර ඉක්මවා ගලා ගෙන ගොස් පොළොවට උරා ගත්තේ ය. (එක් කොටසක් නිවැරදි නම් ලකුණු ½ක් දෙන්න)

(iv) මාලුපැවිදි - උපසම්පදා/ අධිශීලය

බී ගියේ ය - උරා ගත්තේ ය /මැකී ගියේ ය/ සිඳී ගියේ ය/ වියළී ගියේ ය

**(ලකුණු 04යි)**

(ආ) බරණැස් නුවර බඹදත් නම් රජ තමාගේ පුත් සොත්ථිසේන නම් රජ කුමරුවා වැඩි වයසට පැමිණියාහු යුවරජ තනතුරෙහි පිහිටුවා සම්බුලා රාජකුමාරිකාව ඕ හට අගමෙහෙසුන් කොට පාවා දුන්නේ ය. ඕ තොමෝ උතුම් රූ දරන්නී ය. විශිෂ්ට වූ ශරීර වර්ණ ඇති විය. අන්ධකාරයෙහිත් පහන් නැති තැන ලන පහනක් මෙන් බබළන්නී ය. මෙසේ ඔවුන් දෙදෙන ප්‍රියසංවාසයෙන් කලක් විසූ කල්හි කල් යාමකින් සොත්ථිසේන නම් යුවරජහට අසාධ්‍ය වූ කුෂ්ඨ රෝගයක් ඇති වූයේ ය. එකල්හි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දඹදිව ප්‍රසිද්ධ බොහෝ වෙදවරුන් ගෙන්වා පිළියම් කරවාත් සමනය කොටගත නො හී අසාධ්‍යයහ යි අළහ.

(i) බඹදත් රජ තම පුත් කුමරු කිනම් තනතුරක පිහිටවූයේ ද?

(ii) මෙහි වර්ණිත ස්ත්‍රියගේ ශරීර ස්වභාවය උපමා කොට ඇත්තේ කුමකට ද?

(iii) බ්‍රහ්මදත්ත රජතුමා යුවරජුගේ රෝගය අසාධ්‍ය යැයි තීරණය කළේ කෙසේ ද?

(iv) **'ප්‍රියසංවාසයෙන්'** හා **'අසාධ්‍ය'** යන වචනවලට අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(i) යුවරජ තනතුරෙහි/ උපරාජ තනතුරෙහි

(ii) අන්ධකාරයෙහි පහන් නැති තැන දැල්වූ පහනකට

(iii) දඹදිව ප්‍රසිද්ධ වෛද්‍යවරුනට ද සුව කළ නොහැකි වූ බැවින්

(iv) ප්‍රියසංවාසයෙන් - ප්‍රියමනාප ලෙස එකට වාසය කිරීමෙන්

අසාධ්‍ය - සුව කළ නොහැකි

**(එක් කොටසක් නිවැරදි නම් ලකුණු ½ක් දෙන්න)**

**(ලකුණු 04යි)**

(ඉ) දේවයන් වහන්ස, මේ බෙහෙත් කැඳ නම් සියලු ව්‍යාධි නසන උතුම් වූ දිව්‍ය ඖෂධයෙක, මේ බෙහෙත් කැඳින් මඳක් ඇස ඇඳි ඇසිල්ලෙහි අන්ධයෝ ඇස් ලැබෙති. ගඬපොළ කස් ආදී වූ සියලු රෝග සන්හිඳෙයි, මේ කැඳින් මඳක් අනුභව කළ ඇසිල්ලෙහි ගොළුවෝ කතා කෙරෙති, බිහිරි නැති වෙයි, සියලඟ රැලි නැති වෙයි, ඉස නර නැති වෙයි. මේ පෘථිවිතෙලෙහි සත්ත්වයන්ට ඇති වන යම් ම ව්‍යාධියකට මේ ඖෂධය ම පමණ ය. මේ ලෝකයෙහි බොහෝ ධනධාන්‍ය සම්පත් ඇති ව සර්වාභරණයෙන් සැරහී ඇවිදුනේ වී නමුදු ඉදින් රෝගී වී නම් ඉතා නොහොබනේ ම ය. මේ ලෝකයෙහි නිර්ව්‍යාධි බව හා සමාන අන්කිසි ධන ධාන්‍යයෙක් නැතැයි කිසි ව්‍යාධියක් නැති නීරෝගී තැනැත්තේ හැම තැන්හි ම ශොභාමත් ව බබළයි කීහ.

(i) මේ ඖෂධයෙන් සමට හා කෙස්වලට ඇති වන බලපෑම කුමක් ද?

(ii) මෙකී ඖෂධය භාවිත කළ යුත්තේ කෙබඳු ආකාරවලින් ද?

(iii) මේ ලෝකයෙහි ධනධාන්‍යවලට වඩා අගනේ කුමක් ද?

(iv) '**ව්‍යාධි**' හා '**ගඬපොළ කස්**' යන වචනවල අරුත් පහදන්න. (ලකුණු 04 යි.)

(i) සමට - සියලු ශරීරයෙහි/ සමෙහි රැළි නැති වීම

කෙස්වලට - ඉදුණු/ සුදු පැහැ ගැන්වුණු කෙස් නැති වී යාම

**(එක් කොටසක් නිවැරදි නම් ලකුණු ½ක් දෙන්න)**

(ii) ආලේප කිරීම හා පානය කිරීම/ අනුභව කිරීම/ ඇස ඇඳීම/ ගැල්වීම

(iii) නීරෝගීභාවය/ නිර්ව්‍යාධිභාවය/ නිරෝගීභාවය

(iv) ව්‍යාධි - ලෙඩරෝග/ රෝගාබාධ

ගඬපොළ කස් - බිබිලි, ගෙඩි/ කසන හොරි/ දද/ කුෂ්ඨ/ ගඩු

**(එක් කොටසක් නිවැරදි නම් ලකුණු ½ක් දෙන්න)**

**(ලකුණු 04යි)**

(ඊ) විදා සිනිඳු සුදු රස් දිගු පිය පතර
නඳා සුපුන් හිමකර පියකර තිසර
සදා සිතබ සියපත් නුබ තඹර කර
උදා දෙසෙන් වැද එන රඟ බල මිතුර

වියත උදුළ කිරණවු රළ පැහැ පැහැස
දිගත විසුළ සුර ගඟුලැලි දිසි විලස
දියත පතළ පිරිසිඳු සඳ රැස් වෙසෙස
තනෙත පුරා දකු දැහැ ගතෙහි සරතස

(i) සඳ පායා චන්ද්‍රකාන්තිය පැතිරී යාම කවියා දුටුවේ කුමන ආකාරයකින් ද?

(ii) 'හිමකර පියකර තිසර' යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.

(iii) දියත විසිරී ගිය සුර ගඟුලැලි මෙන් දිස් වූයේ කුමක් ද?

(iv) '**තඹරකර**' හා '**කිරණව**' යන පදවල අරුත් ලියන්න. (ලකුණු 04 යි.)

(i) සුපුන් චන්ද්‍රයා නැමති හංසයා සිනිඳු සුදු රැස් නැමති පියාපත් විහිදා ගෙන එන ආකාරයෙන්

(ii) රූපකාලංකාරයකි, ශබ්දාලංකාරයකි/ අනුප්‍රාස

(iii) සඳරැස්/ චන්ද්‍රකාන්තිය/ චන්ද්‍ර රශ්මිය

(iv) තඹරකර - විල/ පියුම්විල/ නෙළුම් විල/ පද්ම තඩාගය

කිරණව - කිරි මුහුද/ කිරි සයුර/ ක්ෂීර අර්ණවය/ ක්ෂීරසාගරය **(ලකුණු 04යි)**

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "ආයේත් පිහිට වන්ට බල ඇති තැනක් කරා ම ය."

(ii) "විචාරවත් කමෙක් ඇත්නම් අන්‍යාය මෙලෙස නො පවතී."

(iii) "එම්බල සොඳුර, දොර ඇරපියව."

(iv) "ඔය හැටි අකමැති නම්, බැරිය කියන්න තිබුණා නෙ."

(v) "කලබල නැතුව ඉන්ඩකො, ඒක මම බලාගන්නම්."

(vi) "කකුල හොලවන්නේ නැතුව එක විදියකට ඉඳපන්." (ලකුණු 08 යි.)

(i) සද්ධර්මරත්නාවලියේ පාටාචාරා කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. තමාගේ සියලු ඥාතීන් අහිමි ව එන පටාචාරා සිටු දියණියන් බුදුන්ගෙන් පිහිට අයැද සිටිනා විට බුදුන්වහන්සේ විසින් සිටු දියණියන්ට මෙසේ ප්‍රකාශ කරන ලදි.

(ii) පන්සිය පනස් ජාතක පොතේ ගණ්ඩතින්දු ජාතකයේ අන්තර්ගත පාඨයකි. එක් රාජ පුරුෂයකු බාල වස්සකු මැරීම හේතුවෙන් මවු දෙන ශෝකයෙන් හඬා ඇවිදී. එවිට රජුගේ පාලනය විවේචනය කරන ගම් දරුවන් විසින් පුරෝහිත බමුණාට මෙසේ ප්‍රකාශ කරන ලදි.

(iii) සද්ධර්මාලංකාරයේ ආරඤ්ඤක අභය ස්ථවිර කථා වස්තුවෙහි අන්තර්ගත පාඨයකි. උපාසකගෙන් ගැහැට විඳ රාත්‍රියේ ම බිරිඳගේ උපකාර අපේක්ෂාවෙන් සිය නිවසට එන හරන්තික සොරා බිරිඳ අමතා මෙසේ පැවසී ය.

(iv) මළගිය ඇත්තෝ නවකතාවෙන් උපුටා ගත් පාඨයකි. ඕකතා සං සමග කෑම ගැනීම සඳහා තමා බැහැරට යන්නේ කැමැත්තකින් නොවන බව ප්‍රකාශ කරන නොරිකෝහට දෙවෙන්දොරා සං විසින් මෙසේ පවසන ලදි.

(v) රත්නාවලී නාට්‍යයේ අන්තර්ගත පාඨයකි. කෙසෙල් උයනේ දී විදූෂක සඟවාගෙන සිටි සිතුවම් පුවරුව වාසවදත්තා ඉදිරියේ බිම වැටෙන විට ඒ පිළිබඳ ව අනතුරු හඟවන උදයන රජතුමාහට විදූෂක විසින් මෙසේ ප්‍රකාශ කරන ලදි.

(vi) මුදියන්සේ මාමා කෙටිකතාවෙන් උපුටා ගත් පාඨයකි. තම නිවසට පැමිණෙන මුදියන්සේ මාමා ඇතුළු පවුලේ සාමාජිකයන් පිළිගැනීම සඳහා සූදානම් වන අවස්ථාවේ දී තම සහෝදරයා වන පියදාස සෝදා පවිත්‍ර කරන මාලනී ඔහු අමතා මෙසේ පැවසුවා ය.

**(ලකුණු 08යි)**

(ඌ) **පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.**

**අතින් දෙන කරල් තුඩ ගා බුදින්න නේ**
**බිතක්කන ඉඳන් නෙත්වට යොමන්න නේ**
**උදේ හවස්කර ගෙයි වට ලඟින්න නේ**
**තොපට ලොව පටුයි පොඩි ගේ කුරුල්ල නේ**

රුවට රුව සමයි තෙපි වී කුරුල්ල නේ
අවට නුබ ගැබේ සිට සිරි බලන්න නේ
බිමට ඉද්ද සේ බැස හැල් නෙළන්න නේ
ගැහැට කැට පහර විඳ දිවි ගෙවන්න නේ

| | |
|---|---|
| **එකට පොදිය එක මල් රැනක** | **සිරි ය** |
| **හවස රිවි කිරණ විසිරෙන්නා** | **සරි ය** |
| **කීං හඬ නගා ඉගිලෙති පා** | **එඩි ය** |
| **හීන් රතු තුඬේ රඳවා අඩු** | **වැඩි ය** |
| **වාන් කෙතේ අස්වනු අඩුවා** | **සැබ ව** |
| **හීන් තුඩු ගසා සොරු ගත්තා** | **සැබ ව** |
| **ඒත් තරහ නැත වී කුරුලනි** | **අස ව** |
| **රුන් සරින් මගෙ හිත යයි තෙපි** | **කැටු ව** |

මෙම පද්‍ය පන්තියේ දී කවියා, ගේ කුරුල්ලන් හා වී කුරුල්ලන්ගේ ස්වභාවයත්, චර්යා රටාත් වර්ණනා කරමින් එකිනෙකට වෙනස් පුද්ගල කණ්ඩායම් දෙකක ස්වරූපය පිළිබඳ අපූර්ව සංකල්පනාවක් පාඨක සිත්සතන්හි ජනිත කිරීම අරමුණු කරගෙන තිබේ.

ගේ කුරුල්ලන් කවරෙකුගේ හෝ පිහිටෙන් යැපෙමින් පටු සීමාවක් තුළ ජීවිතය ගෙන යන ආකාරයත්, වී කුරුල්ලන් බාහිර ලෝකයෙන් නොයෙක් අතවර ලබමින් වුව ද ගොදුරු සොයා ගැනීමේ සිය ඉලක්ක සපුරා ගැනීමට සමත්වන ආකාරයත්, ඔවුන්ගේ සුන්දරත්වය හා එඩිතර භාවයත් කවියාගේ වර්ණනයට ලක් වේ. එසේ ම මෙම කවිපෙළ ඇසුරෙන් කවියා සංකේතාත්මක ලෙස එකිනෙකට වෙනස් සමාජ පන්ති දෙකකට අයත් වූවන්ගේ ස්වභාවය හා චර්යාවන් පිළිබඳ ව විවරණයක් ඉදිරිපත් කරන ආකාරය සැලකිල්ලට ගත හැකි ය.

එහි දී ගේ කුරුල්ලන් ඇසුරෙන් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ නොවන, හුදෙක් පරිභෝජන කාර්යයෙහි පමණක් නියැළෙන, සමාජ සුරක්ෂිතතාවෙන් පිරිපුන් පුද්ගල සමූහය ද, වී කුරුල්ලන් ඇසුරෙන් සමාජයේ නොයෙක් පරිපීඩනයන්ට ලක්වෙමින් ස්වකීය අරමුණු ඉටුකර ගැනීමට එඩිතර ව කැපවන ශ්‍රමික පිරිස නියෝජනය කරන සමාජ කොට්ඨාසය ද නිරූපණය වෙතැ යි උපකල්පනය කළ හැකි ය. මෙහි දී වී කුරුල්ලන්ගේ කාර්යක්ෂමතාව හා සාමූහිකත්වය කවියාගේ ප්‍රසාදයට ලක් වන ආකාරය ද පද්‍ය පන්තියෙන් ධ්වනිත වේ.

මෙම පද්‍ය නිර්මාණයේ දී ජන කවියේ ආභාසය ලබමින් භාෂාව, සංකල්පරූප හා ආකෘතිය නිර්මාණය කරන කවියා මානව හිතවාදී දෘෂ්ටියක් ප්‍රකට කරන ආකාරය දැක ගත හැකි ය.

භාෂා භාවිතය සඳහා,
කරල් බුදින්නනේ, බිතක්කන, කැටපහර, කීං හඬ, හීන් රතු තුඬේ, වාන් කෙතේ, අස්වනු, රුන් සරින් යන ආදි වචන ද,

සංකල්ප රූප සඳහා,
''එකට පොදිය එක මල් රැනක සිරිය
හවස රිවි කිරණ විසිරෙන්නා සරිය''

''රුවට රුව සමයි තෙපි වී කුරුල්ලනේ''

''බිමට ඉද්ද සේ බැස හැල් නෙළන්නනේ''

වැනි යෙදුම් ද ගත හැකි ය.

මෙහි ඇත්තේ එළිසම සහිත සිවුපද ආකෘතිය යි.

**(ලකුණු 16යි)**

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා:




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 99%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 55%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 9%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 30ට වඩා ලබා ගත් පිරිස 9%ක් වන අතර 36%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 21ට අඩුවෙනි.




- ⋆ මෙම ප්‍රශ්නයට කොටස් 6ක් ද, අනුකොටස් 23ක් ද ඇති අතර, පහසුතාව 40%ට වඩා වැඩි අනුකොටස් 14ක් ඇත. 10%ට වඩා අඩු පහසුතාව ඇති අනුකොටස් 2ක් ඇත.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (අර්ථාවබෝධය)**

මෙම පත්‍රයේ පළමු වන ප්‍රශ්නය කොටස් හයකින් සමන්විත වේ. මේ යටතේ අර්ථාවබෝධය සඳහා අ, ආ, ඉ, ඊ යන කොටස් හතර ද අවස්ථා සම්බන්ධය සඳහා (උ) කොටස ද, රසාස්වාදය සඳහා (ඌ) කොටස ද වෙන් කෙරේ.

අර්ථාවබෝධය සඳහා ඇති කොටස් හතරෙහි සෑම කොටසක් ම අනුකොටස් හතරකින් යුක්ත වේ. ඒවා තෝරාගෙන ඇත්තේ නිර්දිෂ්ට පැරණි සාහිත්‍ය ග්‍රන්ථවලිනි. මෙම ප්‍රශ්න ආශ්‍රිත ව අපේක්ෂකයන්ගේ ඉහළ සාධන මට්ටමක් ප්‍රදර්ශනය වනුයේ ඡේදය ඇසුරෙන් ඍජුව ම පිළිතුර ලබා ගත හැකි ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී ය. ඡේදයේ සංකීර්ණ වාක්‍ය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව පිළිතුරු ලිවිය යුතු අවස්ථාවල දී හා දුරවබෝධ පදවලට අරුත් සැපයීමේ දී අපේක්ෂකයන්ගේ සාධන මට්ටම පහත වැටී තිබේ.

අපේක්ෂකයන් එක් එක් කොටස්වලට පිළිතුරු ලබා දී ඇති ආකාරය විමසා බැලීමේ දී මෙම කරුණ වඩාත් පැහැදිලි කරගත හැකි වේ. නිදසුන් ලෙස (ආ) හා (ඊ) යන කොටස්වල (iv) අනුකොටසට ලබා දී ඇති පිළිතුරුවල සාධන මට්ටම පහළ තත්ත්වයක පවතී. එසේ ම (අ) කොටසේ (ii) අනුකොටසටත් (ඊ) කොටසේ (i) අනුකොටසටත් ලබා දී ඇති පිළිතුරුවලින් ද මෙම කරුණ තවදුරටත් තහවුරු වේ. විශේෂයෙන් ම (ඊ) කොටසට අදාළ ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගේ පිළිතුරුවල සාධන මට්ටම අවම තත්ත්වයක පැවති බව පෙනේ. සංකීර්ණ වාක්‍ය හා පද්‍ය කොටස් ඇසුරෙන් පිළිතුරු ලිවීම අපේක්ෂකයන්ට දුෂ්කර වී ඇති බව ඉන් පැහැදිලි වේ. එහි ප්‍රශ්න දෙකක පහසුතාව 10%ටත් වඩා අවම මට්ටමක පවතී.

**නිගමන හා යෝජනා**

මේ අනුව නිර්දිෂ්ට සම්භාව්‍ය ගද්‍ය පද්‍ය කෘති මැනවින් කියවා අර්ථ අවබෝධ කර ගැනීම කෙරෙහි අපේක්ෂකයන්ගේ පරිචය මීට වඩා ඉහළ මට්ටමක පැවතිය යුතු අතර, අර්ථ අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීමට ගුරුභවතුන් ද වඩාත් යොමු විය යුතු ය. අපේක්ෂකයන් තුළ තර්කණ හා විශ්ලේෂණාත්මක හැකියාව ඇති කිරීම සඳහා අභ්‍යාස කරවීම මගින් ඔවුන්ගේ සාධන මට්ටම් ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

එසේ ම මෙම ගද්‍ය පද්‍ය පාඨ ඇසුරින් පිළිතුරු ලිවීමේ දී යොදා ගත යුත්තේ වර්තමාන ලේඛන ව්‍යවහාරය වන බවත්, සම්මත ව්‍යාකරණ රීතිවලට අනුකූල ව එම පිළිතුරු ඉදිරිපත් කළ යුතු බවත්, අපේක්ෂකයන් අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (අවස්ථා සම්බන්ධය)**

(උ) කොටස යටතේ ඇති උද්ධෘත පාඨවල අවස්ථා සම්බන්ධය දැක්වීමේ දී ප්‍රශ්නයේ පහසුතාව ප්‍රදර්ශනය වී ඇත්තේ 49%ක ප්‍රතිශතයකිනි.

මෙහි (i), (ii), (iii) අනුකොටස් නිර්දිෂ්ට පැරණි සාහිත්‍යයෙන් ද, (iv), (v), (vi) අනුකොටස් නිර්දිෂ්ට නූතන සාහිත්‍යයෙන් ද උපුටා ගෙන ඇත. පැරණි සාහිත්‍යය අතුරෙන් විෂය නිර්දේශයට ඇතුළත් කර ඇත්තේ ජාතක කතා, සද්ධර්මරත්නාවලි කතා හා සද්ධර්මාලංකාර කතා සීමිත සංඛ්‍යාවක් පමණි.

එහෙත් නූතන සාහිත්‍යය යටතේ නවකතාවක් ද, නාට්‍යයක් ද, කෙටිකතා 12ක් ද, පද්‍ය 23ක් ද නිර්දේශ වී තිබේ. මේවායෙන් උපුටා ගත් උද්ධෘතවලට පිළිතුරු ලිවීමේ දී අපේක්ෂකයන් ඉහළ සාධන මට්ටමක් පෙන්වා නැත. පැරණි සාහිත්‍යය ඇසුරෙන් සීමිත කතා වස්තු ප්‍රමාණයක් නිර්දිෂ්ට ව තිබුණ ද ගණ්ඩතින්දු ජාතකයෙන් දී ඇති උද්ධෘත පාඨයේ පහසුතාව ඉතා අවම මට්ටමක පැවති බව දක්නට ලැබිණි.

**නිගමන හා යෝජනා**

පැරණි සාහිත්‍යයට අදාළ කතාවස්තු අතුරෙන් අපේක්ෂකයන්ගෙන් වැඩි අවධානය දිනා ගෙන ඇත්තේ සද්ධර්මරත්නාවලි හා සද්ධර්මාලංකාර කතා ය. ජාතක කථා කෙරෙහි ඔවුන්ගේ වැඩි ආකර්ෂණයක් නොමැති බව දක්නට ඇත. එබැවින් ජාතක කථා පරිශීලනයට ද අපේක්ෂකයන් තුළ පෙලඹවීමක් ඇති කරලීම වැදගත් වේ. එසේ ම නූතන සාහිත්‍ය කෘති ද නිරන්තරයෙන් පරිශීලනය කිරීමත්, ඒවායේ අවස්ථා සම්බන්ධ හඳුනා ගැනීම හා මතකයේ රඳවා ගැනීමත් අවශ්‍ය වේ.

එසේ මතක තබා ගන්නා අවස්ථා, සිද්ධි ඇසුරෙන් ප්‍රශ්නයට අදාළ කරුණු නිශ්චිත ව ඉදිරිපත් කිරීමත් වැදගත් වේ. එනම් කවුරුන් විසින්, කා හට, කුමක් අරබයා, කෙබඳු අවස්ථාවක ඉදිරිපත් කළේ ද යන්න නිශ්චිත ව, පැහැදිලි ව, නිරවුල් ලේඛන ශෛලියකින් ඉදිරිපත් කළ යුතු ය.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (රසාස්වාදය)**

(ඌ) කොටස යටතේ රසාස්වාදය සඳහා දී ඇති පද්‍ය නිර්මාණයට 58%ක පහසුතාවක් ලැබී ඇත. එය තරමක සතුටුදායක අගයකි. මෙය නූතන පද්‍ය නිර්මාණයක් වීම හා සරල බස්වහරකින් ඉදිරිපත් වීම හේතුවෙන් අපේක්ෂකයන්ට රසවිඳීමේ පහසුවක් ඇති වී තිබේ. එහෙත් එහි දී වැදගත් වන්නේ පද්‍ය නිර්මාණයක් රස වින්දනය කිරීමේ මූලධර්ම හඳුනාගෙන ඒ අනුව සිය රසාස්වාදය ඉදිරිපත් කිරීමට පෙලඹීම ය.

මෙම පද්‍ය නිර්මාණය රස විඳීමේ දී අපේක්ෂකයන්ගේ සාධන මට්ටම අඩු වීමට හේතු වී ඇත්තේ පද්‍ය නිර්මාණයෙන් ගෙන එන ව්‍යංග්‍යාර්ථ කෙරෙහි නොව වාච්‍යාර්ථ කෙරෙහි ඔවුන් වැඩි සැලකිල්ලක් දැක්වීම යි. කාව්‍යෝපක්‍රම හා භාවිකාර්ථවත් භාෂා භාවිතය පිළිබඳ ව අපේක්ෂකයන් වැඩි අවධානයක් යොමු නො කිරීම අඩුපාඩුවකි. මේ නිසා අපේක්ෂකයන්ගේ සාධන මට්ටම ද පහළ අයගකට පත් වී ඇත.

**නිගමන හා යෝජනා**

පද්‍ය රසාස්වාදයේ දී එහි මූලධර්ම පිළිබඳ ව අපේක්ෂකයා ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගැනීම වැදගත් වනවා සේ ම තම අවබෝධය ප්‍රායෝගික ව භාවිත කිරීමේ හුරුවක් ලබා ගැනීම ද අත්‍යවශ්‍ය වේ. බහුතරයක් අපේක්ෂකයන් කවිවල අර්ථ පමණක් ලියා දැක්වීමේ දුබලතාවෙන් මිදිය හැකි වන්නේ මූලධර්ම භාවිතයට ගැනීම ප්‍රගුණ කළ විට ය. ගුරු සිසු දෙපක්ෂයේ අවධානය මේ සඳහා යොමු වීම අවශ්‍ය ය.

## 02 ප්‍රශ්නය

**2.** **"මිනිස් සිතුවිලිවල යථාස්වරූපය විවිධ අරමුණු ඔස්සේ නිරූපණය වන ආකාරය පැහැදිලි කිරීම සද්ධර්මරත්නාවලී කතුවරයාගේ අභිප්‍රාය විය." නියමිත කතා ඇසුරෙන් විමසන්න.** **(ලකුණු 15 යි.)**

**නැතහොත්**

**විවිධ අවස්ථා නිරූපණයෙහි දී භාෂා භාවිතයෙහි ලා ජාතක කතාකරුවා දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී දැයි නියමිත කතා දෙකක් අනුසාරයෙන් පහදන්න.** **(ලකුණු 15 යි.)**

පුද්ගලයාගේ විවිධ අරමුණු ඔස්සේ මිනිස් සිතුවිලිවල යථාස්වරූපය නිරූපණය කිරීම සද්ධර්මරත්නාවලි කතුවරයාගේ අභිප්‍රාය වන ආකාරය පහත දැක්වෙන කරුණු ඔස්සේ ඉදිරිපත් කළ හැකි ය.

පටාචාරා කතා වස්තුව :-

- සිටු දියණියන් සැපතින් ආඪ්‍ය වූ සිටු මැඳුරේ ජීවිතය හැර දමා දාසයකු සමග පලා යාමට තීරණය කිරීම
- දුගී ගැහැනියකගේ සාමාන්‍ය දෛනික දිවි පෙවෙතකට හුරු වීම
- දරුවන් ලැබීමේ දී දෙමාපිය සහාය අවශ්‍ය වන බව වටහා ගැනීම හා තම අරමුණ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන අභියෝගයන්ට මුහුණ දීම
- සැමියාගේ මරණෙන් පසු ව දෙමාපියන්ගේ පිළිසරණ පතා යාම
- ගිහිගෙයි ආදීනව දැක මහණ වන්නට තීරණය කිරීම

මච්ඡරිය කෝසිය කතා වස්තුව :-

- සිටාණන් වස්තුව වියදම් කිරීමට ඇති බිය හේතුවෙන් කබලු කෑමේ ආශාව සඟවාගෙන සිටීම
- සිටාණන්ගේ ඇඹේණියන් බොහෝ දෙනා සමග කබලු කෑමට යෝජනා කිරීම
- මුගලන් තෙරුන්ට කබලු දෙන්නට වෙතැ යි සිටාණන් තුළ ඇති වන බිය හා කෝපය හේතුවෙන් ඔහු හැසිරෙන ආකාරය
- සිත පහදවාගෙන බුදු පාමොක් සංඝයාවහන්සේට කබලු පිළිගැන්වීමට තීරණය කිරීම

නැතහොත්

විවිධ අවස්ථා නිරූපණයේ දී එම අවස්ථාවලට උචිත ආකාරයෙන් භාෂාව යොදා ගැනීමට ජාතක කතාකරු උත්සාහ දරන ආකාරය පිළිබඳ ව පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

- වර්ණනාත්මක රීතියක් යොදා ගැනීම

  උදා :- ඡද්දන්ත ජාතකයේ අටළොස් වනගහණ, සප්ත පර්වත හා ඡද්දන්ත විල පිළිබඳ වර්ණනා, සම්බුලා ජාතකයේ ආශ්‍රමය පිහිටි වන ප්‍රදේශය, සම්බුලා බිසවගේ රූප සෞන්දර්යය පිළිබඳ කෙරෙන වර්ණනා

- ශබ්ද මාධුර්යය ඇති කිරීමෙහි ලා රචකයා අනුප්‍රාසවත් තත්සම යෙදුම් භාවිත කිරීම

  උදා :- ඡද්දන්ත ජාතකය

  ''සත්වයන් ජාතිකාන්තාරාදීන් තරණය කොට නිර්වාණ ක්ෂේමභූමියට පමුණුවන හෙයින් ශාස්තෘ නම් වූ පරාර්ථ සාධක පරම කාරුණික ... ''

- ගණ්ඩතින්දු ජාතකය

  ''තව ද එක් සමයෙක්හි ත්‍රිභුවනාභරණ ප්‍රවණන්තඃකරණ සමුද්ගපූරිත ගුණමණි නිකර රංජිත විනේජනයන් ඇති ...''

- තාත්විකත්වයට නැඹුරු වූ අව්‍යාජ රීතියක් යොදා ගැනීම

  උදා :- දේවධර්ම ජාතකයේ බහු භාණ්ඩික භික්ෂුව ගැන කෙරෙන වර්ණනය හා ඡද්දන්ත ජාතකයේ වැදි පුත්‍රයා ඇත් රජුට විදීම සඳහා වළ සකස් කරන අවස්ථාව ඉදිරිපත් කර ඇති ආකාරය.

- ගැමි බස්වහර යොදා ගැනීම

  උදා- මරාටු පරඬලා, කුරා කුහුඹු, බොරු ලෙඩ ගසා, කොක්ක ඇද ගෙන, වළක් ගසා, දඬු මැස්සේ, කුඩා කොල්ලො, බත් මාළු පිසවාගෙන, අවු ගස්වන කලට

- සරල කෙටි වැකි හා සංවාදාත්මක යෙදුම් උපයෝගි කර ගැනීම

- ධර්ම දේශනා රීතිය උපයෝගි කර ගැනීම

  උදා :- ගණ්ඩතින්දු ජාතකයේ බෝධිසත්වයන් පංචාල රජුට අනුශාසනා කරන අවස්ථාව.

  සම්බුලා ජාතකයේ තපස් රකිනා රජතුමා සොත්ථිසේන රජුට අනුශාසනා කරන අවස්ථාව.

මෙම කරුණුවලට අමතර ව පිළිතුරට අදාළ කරගත හැකි වෙනත් අවස්ථා ඇසුරෙන් ඉදිරිපත් කරන කරුණු ද තිබිය හැකි ය. නියමිත ජාතක කතා දෙකක් ඇසුරෙන් පිළිතුරු සපයා තිබීම අවශ්‍ය වේ.

**(ලකුණු 15යි)**

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 89%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 00 - 03 | ප්‍රාන්තරයේ | 4%ක් ද, |
| ලකුණු | 04 - 07 | ප්‍රාන්තරයේ | 15%ක් ද, |
| ලකුණු | 08 - 11 | ප්‍රාන්තරයේ | 53%ක් ද, |
| ලකුණු | 12 - 15 | ප්‍රාන්තරයේ | 28%ක් ද, |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 28%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 19%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය. ඉන් පළමුවන විකල්පයෙහි පහසුතාව 64%ක් වන අතර දෙවන විකල්පයෙහි පහසුතාව 41%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්න සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයට අයත් සද්ධර්මරත්නාවලියෙන් හා ජාතක පොතෙන් සකස් වී ඇත. මෙහි පළමු වන විකල්පයෙහි මිනිස් සිතිවිලිවල යථා ස්වරූපය විවිධ අරමුණු ඔස්සේ නිරූපණය වන ආකාරය ගැන විවරණය කිරීම අපේක්ෂිත යි. මෙමගින් විවිධ අවස්ථානුකූල ව මිනිස් සිතිවිලි ක්‍රියාත්මක වන ආකාරයත්, ඒවායේ යථා ස්වරූපයත් පැහැදිලි කිරීම සඳහා කරුණු දැක්වීම අපේක්ෂා කෙරේ.

දෙවන විකල්පයේ දී විවිධ අවස්ථා නිරූපණයට යෝග්‍ය ආකාරයෙන් භාෂාව භාවිත කිරීමට ජාතක කතාකරු දක්වා ඇති උත්සාහයෙහි සාර්ථකත්වය විමර්ශනය කෙරේ. මෙයින් පහසුතාව වඩාත් නිරූපණය වන්නේ පළමුවන විකල්පයට ලියූ පිළිතුරු මගිනි. එය 64%කි. දෙවන විකල්පයෙහි පහසුතාව 41%කි. එමගින් පෙනෙන්නේ දෙවන විකල්පය සඳහා පිළිතුරු ගොනු කිරීමට අපේක්ෂකයන් තුළ එතරම් හැකියාවක් නොමැති වූ බව යි.

**නිගමන හා යෝජනා**

සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට වී ඇත්තේ කතාවස්තු දෙකක් වන අතර, ජාතක පොතෙන් කතාවස්තු හතරක් නිර්දිෂ්ට වී ඇත. මේ අනුව සද්ධර්මරත්නාවලියේ ප්‍රශ්න කතාවස්තු දෙකක් පමණක් පාදක කොටගෙන ඉදිරිපත් කර ඇත. ජාතක පොතෙන් කතාවස්තු හතරක් නිර්දිෂ්ට කොට ඇති අතර, එයින් දෙකක් පාදක කොටගෙන පිළිතුරු ඉදිරිපත් කළ යුතු විය. මෙහි දී අපේක්ෂකයන් තුළ ඇතිවන්නේ අවිනිශ්චිතභාවයකි. කතාවස්තු හතරෙන් දෙකක් ආශ්‍රිත ව අදාළ කරුණු ගොනුකර ගැනීම පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගැනීම අපේක්ෂකයන්ට දුෂ්කර වූවා විය හැකි ය. කෙසේ වුවත් ජාතක පොත ආශ්‍රයෙන් ඉදිරිපත් කර ඇත්තේ භාෂා ආශ්‍රිත ප්‍රශ්නයක් වන නිසා විවිධ අවස්ථා නිරූපණය සමග එය සම්බන්ධ කිරීමට යෝග්‍ය දැනුමක් අපේක්ෂකයන් සතු ව පැවතීම අවශ්‍ය වේ. මේ අනුව කතාවස්තුවල සාර්ථකත්වය උදෙසා භාෂා භාවිතයේ පවත්නා යෝග්‍යතාව ගැන ලියැවුණු ශාස්ත්‍රීය ලිපිලේඛන පරිශීලනය කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු විය යුතු ය.

## 03 ප්‍රශ්නය

**3.** **"බණකතා රසාස්වාදය අනුසාරයෙන් පොදු ජනයාට ධර්මාවබෝධයක් ලබා දීම සද්ධර්මාලංකාර කතුවරයාගේ අපේක්ෂාව විය." නියමිත කතාවස්තු ඇසුරු කොට මේ කියමන විමසන්න.** **(ලකුණු 15 යි.)**

බණ කතා රසවිඳින අතර ම පොදු ජන ජීවිත සදාචාරසම්පන්න මාර්ගයට අවතීර්ණ කරවීම සඳහා අවශ්‍ය වන ධර්මාවබෝධය ලබා දීමට සද්ධර්මාලංකාර කතුවරයා සමත් වන ආකාරය පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කළ යුතු ය.

ඒ අනුව නිර්දිෂ්ට කතාවල අන්තර්ගත වන දානය, ශ්‍රද්ධා සම්පන්නභාවය, සමානාත්මතාව, යහගුණ ඇගයීම, මෛත්‍රී ගුණය, අසරණයන්ට පිහිට වීම වැනි යහපත් ගුණධර්ම ද සොරකම, කෝපය, නින්දා කිරීම, වැනි අයහපත් ධර්ම ද පුද්ගලයාට විපාක ලබා දෙන ආකාරය පිළිබඳ ව පොදු ජනයාට අවබෝධයක් ලබා දීම කතුවරයාගේ අභිප්‍රාය යි. නියමිත කතා ඇසුරෙන් සපයාගත් නිදසුන් මගින් මෙම කරුණු පෙන්වා දීම පිළිතුරෙන් අපේක්ෂිත යි.

**(ලකුණු 15යි)**

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 73.37%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 51%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 30%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 30%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 19%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




- ★ මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 62%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

පොදු ජනයාට ධර්මාවබෝධය ලබා දී ඔවුන් සදාචාරසම්පන්න මාර්ගයට අවතීර්ණ කරලීමත්, රසවින්දනය ලබා දීමත් සඳහා සද්ධර්මාලංකාර කතුවරයා ගන්නා උත්සාහය නිර්දිෂ්ට කතාවස්තු දෙක ඇසුරින් මෙහි දී විමර්ශනය කළ යුතු විය. එමගින් යහගුණ දහම් රැකීමත්, අයහපත් චර්යාවලින් වැළකීමත් සඳහා පොදු ජනතාව යොමු කිරීමට කතුවරයා දැරූ උත්සාහය විචාරයට ලක් කළ යුතු විය.

මෙහි දී අපේක්ෂකයන් වැඩි ප්‍රතිශතයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇතත්, පහසුතාව වූයේ 62%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 30%ක් වූ අතර, අපේක්ෂකයන්ගෙන් 19%ක් ලබාගෙන තිබුණේ ලකුණු 8ට අඩුවෙනි.

**නිගමන හා යෝජනා**

නියමිත කතාවස්තු මතකයේ තබා ගැනීම පමණක් නොව ඒ අසුරෙන් කතුවරයා සමාජයට ලබා දෙන උපදේශාත්මක අදහස් කෙරෙහි ද අවධානය යොමු කිරීමට අපේක්ෂකයන් පෙලඹවිය යුතු ය. බණකතා කියවා රසවිඳීමත් ද, එමගින් ඇති වන උපදේශාත්මක නැඹුරුව කෙරෙහි ඔවුන්ගේ විචාරාක්ෂිය යොමු වීම ද සිදුවිය යුතු ව තිබුණි. එහෙත් මේ පිළිබඳ ව ගැඹුරින් අවධානය යොමු නො කළ නිසා සාර්ථක පිළිතුරු සැපයීමට පැවති අවස්ථාව අපේක්ෂකයන්ගෙන් දුරස්ථ වී ගිය බවක් පෙනේ.

### 04 ප්‍රශ්නය

**4.** **ගිරා සන්දේශ කතුවරයා, සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනයේ ස්වරූපය ඉදිරිපත් කරන අයුරු තොටගමුවේ විජයබා පිරිවෙන් වැනුමේ පද්‍ය තුනක්වත් ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න.** (ලකුණු 15 යි.)

ගිරා සංදේශයේ ඇතුළත් පිරිවෙන් වැනුමෙහි දක්නට ලැබෙන්නේ සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයක ස්වරූපය යි. කෝට්ටේ යුගයේ දී පිරිවෙන් අධ්‍යාපනය ලද පැවිදි හා ගිහි ශිෂ්‍ය පිරිස, ආගමික කරුණු මෙන් ම ලෞකික විෂය කරුණු ද හදාළ අයුරු මින් ඉදිරිපත් කෙරේ. ඒ අනුව ත්‍රිපිටකය වන පොත් කරන හා එහි ගැඹුරු පදාර්ථ විමසන භික්ෂු පිරිස ද, ව්‍යාකරණ ශාස්ත්‍රය ප්‍රගුණ කරන සාමණේරවරුන් ද වේදාර්ථ ධාරණය කරන බ්‍රාහ්මණ පිරිස ද, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය, වෛද්‍ය ශාස්ත්‍රය, අර්ථ ශාස්ත්‍රය හා සංස්කෘත, පාලි, සිංහල, දෙමළ ආදි භාෂාවන්ගෙන් ලියවුණු නොයෙක් කාව්‍ය නාටක ග්‍රන්ථ හදාරන ශිෂ්‍ය කාණ්ඩායම් ද කවියාගේ වර්ණනයට ලක් වන ආකාරය නිදසුන් පද්‍ය තුනක්වත් ඇසුරින් ඉදිරිපත් කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

**(ලකුණු 15යි)**

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 13%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 10%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 10%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 66%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 31%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

ගිරා සංදේශය ආශ්‍රයෙන් සකස් වී ඇති මෙම ප්‍රශ්නය මගින් සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනයේ ස්වරූපය ගිරා සංදේශ කතුවරයා ඉදිරිපත් කර ඇති අයුරු විමසා බැලීමක් සිදු කෙරිණි. මෙහි දී තොටගමුවේ විජයබා පිරිවෙන් වැනුමෙන් උදාහරණ තුනක්වත් උපුටා දැක්වීම පිළිතුරෙන් අපේක්ෂිත ය. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට ඉදිරිපත් වූ විභාග අපේක්ෂකයන් ප්‍රතිශතයක් ලෙස 13%කි. ඉතා අඩු අපේක්ෂකයන් ප්‍රමාණයක් පිළිතුරු සැපයීමට මෙම ප්‍රශ්නය තෝරා ගත් බව මෙයින් ගම්‍යමාන වෙයි. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබාගත් පිරිස 10%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 66%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 08ට අඩුවෙනි.

**නිගමන හා යෝජනා**

මීට පෙර වසරවලට වඩා නවමගක් ගත් ප්‍රශ්නයක් වශයෙන් මෙය හැඳින්විය හැකි ය. සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනයේ ස්වරූපය නිරූපණය කිරීම සඳහා කවියා යොදා ගත් වස්තු හා උපාය මාර්ග පිරිවෙන් වැනුම ඇසුරෙන් පමණක් විමසීම මෙයින් අපේක්ෂිත ය. ගිරා සංදේශයෙහි සමස්ත වර්ණනා පිළිබඳ ව ම අපේක්ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු අතර, මෙබඳු මුහුණුවරක් ගන්නා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ද ඔවුන් තුළ ප්‍රාගුණ්‍යයක් ඇති කිරීමේ අවශ්‍යතාව මෙහි දී පැහැදිලි වේ.

## 05 ප්‍රශ්නය

**5.** “මානව ජීවන චර්යා කෙරෙහි පුද්ගලයන් හෙළන උපේක්ෂා සහගත දෘෂ්ටිය ‘මළගිය ඇත්තෝ’ නවකතාවෙන් නිරූපණය වේ.” විමසන්න. (ලකුණු 15 යි.)

මළගිය ඇත්තෝ නවකතාවෙන් මානව ජීවන චර්යාවන් කෙරෙහි පුද්ගලයා හෙළන උපේක්ෂා සහගත දෘෂ්ටිය නිරූපණය කෙරෙන ආකාරය පිළිබඳ ව පහත දැක්වෙන කරුණු පදනම් කරගත හැකි ය.

- නවකතාව ආරම්භයේ දී දෙවෙන්දොරා සංගේ ජීවන දැක්ම ඉදිරිපත් කර ඇති ආකාරය
- දෙවෙන්දොරා සංගේ සිතුවම් ඇඳීමේ දක්ෂතා පිළිබඳ ව විචේචකයන් හෝ අන්‍යයන් කරන ප්‍රශංසා පිළිබඳ ව ඔහු විශේෂ සතුටක් නොදැක්වීම
- ජපන් සංස්කෘතිය පිළිබඳ ව දෙවෙන්දොරා සං තුළ ඇති අවබෝධය සම්බන්ධයෙන් අන්‍යයන්ගේ ප්‍රශංසාවලින් උදම් නොවීම
- ඕකතා සං හා නොරිකෝ සං සම්බන්ධ සිදුවීම්වල දී ඇතැම් විට උපේක්ෂා සහගත ලෙස සිතන්නට දෙවෙන්දොරා සං යොමු වීම
- කියොතෝ යාමට ආසන්න වන විට නොරිකෝ සංගෙන් වෙන් වීමට සිදුවීම පිළිබඳ සිතන ආකාර ය
- මමෙවාකාගේ හැසිරීම් පිළිබඳ ව ඇතැම් විට උපේක්ෂා සහගත ව සිතන්නට යොමු වීම
- නොරිකෝ සංගේ විවාහ යෝජනාව පිළිබඳ ඇතැම් විට මධ්‍යස්ථ ලෙස සිතන්නට වෑයම් කිරීම
- ජීවිතයේ සෞන්දර්ය මෙන් ම මරණයේ සෞන්දර්ය ද එක ලෙස අගය කිරීම
- දෙවෙන්දොරා සං විවාහය සම්බන්ධයෙන් ස්ථිර තීරණයක් නොගැනීම පිළිබඳ ව නොරිකෝ සං උරණ නොවීම
- නොරිකෝගේ පළමු පෙම්වතා සිය යෙහෙළිය සමග විවාහ වීම පිළිබඳ ව මැදහත් ලෙස බැලීම
- කුඩා කල සිට නොරිකෝ සං සිය පවුල් පරිසරය ඇසුරෙන් ලබන පීඩාවන් දරා සිටීමට ඇ තුළ ඇති හැකියාව

**(ලකුණු 15යි)**

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 46.46%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 12%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 12%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 38%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 52%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

පිළිතුරු ලිවීමට තෝරා ගත් විභාග අපේක්ෂකයන් ප්‍රතිශතයක් ලෙස 46%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබාගත් පිරිස 12%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 38%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 08ට අඩුවෙනි. මානව ජීවන චර්යා කෙරෙහි පුද්ගලයන් හෙළන උපේක්ෂා සහගත දෘෂ්ටිය මළගිය ඇත්තෝ නවකතාවෙන් විමසා බැලීම මෙම ප්‍රශ්නයේ අරමුණ වී තිබුණි. නවකතාවේ එන චරිත මුහුණ දෙන විවිධ අභියෝග හමුවේ උපේක්ෂා සහගත වන අයුරු උදාහරණ මගින් පෙන්වා දීමක් අපේක්ෂකයන් කළ යුතු ව තිබුණි. ප්‍රශ්නය මැනවින් හඳුනා ගෙන පිළිතුරු සැපයීමට බොහෝ අපේක්ෂකයන්ට හැකියාවක් නොතිබුණු බව ඔවුන් සැපයූ පිළිතුරුවලින් අනාවරණය විය.

**නිගමන හා යෝජනා**

බොහෝ පිළිතුරුවල අඩංගු වී තිබුණේ මළගිය ඇත්තෝ නවකතාවේ එන කතා සාරය යි. කවතාවක් කියවීමේ දී අපේක්ෂකයන් මෙහි කථා සාරය පමණක් නොව නවකතාවේ විවිධ පැතිකඩ පිළිබඳ කරුණු විග්‍රහ කිරීම ද අවශ්‍ය වේ. මේ යටතේ මානව ජීවන චර්යා කෙරෙහි පුද්ගලයන් හෙළන උපේක්ෂා සහගත ආකල්ප මේ නවකතාවෙන් නිරූපණය වන ආකාරය පිළිබඳ ව අපේක්ෂකයන්ට වැටහීමක් නොමැති වූ බව පෙනෙයි. මේ අනුව අපේක්ෂකයන් නිර්දිෂ්ට නවකතා කියවීමේ දී ඒවාට අදාළ විවිධ අංශ ගැන ද ගැඹුරු අධ්‍යයනයක් කිරීමේ අවශ්‍යතාව මෙහි දී පැහැදිලි වේ.

**06 ප්‍රශ්නය**

**6. දරිද්‍රතාව හේතුවෙන් පීඩාවට පත් වන ජන ජීවිතයෙහි යථාර්ථය කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා නූතන සිංහල කෙටිකතාකරුවන් සමත් වී ඇති ආකාරය නියමිත කෙටිකතා තුනක්වත් ඇසුරෙන් විභාග කරන්න.**

(ලකුණු 15 යි.)

දරිද්‍රතාව හේතුවෙන් පීඩනයට පත් වන ජන ජීවිතයේ යථාර්ථය කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට නූතන සිංහල කෙටිකතාකරුවා. සමත් ව ඇති ආකාරය නිර්දිෂ්ට ග්‍රන්ථයේ ඇතුළත් සද්ගුණවත් සාමෙල්, ප්‍රදීපාගාරය යට, අපේක්ෂා, තාත්තාගේ මළගම, තාත්තා, මාවතේ දරුවෝ වැනි නිර්මාණ ආශ්‍රයෙන් පැහැදිලි කළ හැකි ය.

මෙම කතාවලින් ග්‍රාමීය ජනයාගේ දිළිඳුකමත්, නාගරික ජනයාගේ දිළිඳුකම හා බැඳුණු සංකීර්ණ ප්‍රශ්නත් හේතුවෙන් ඔවුන්ට ඇති වන පීඩනය අනාවරණය කෙරෙන ආකාරය කෙටි කතා තුනක් ඇසුරින් ඉදිරිපත් කර තිබීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

**(ලකුණු 15යි)**

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 43%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 9%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 49%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 20%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 20%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 31%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




- ⋆ මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 53%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

නිර්දිෂ්ට කෙටිකතා සංග්‍රහය ඇසුරින් සකස් වූ මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වූයේ දරිද්‍රතාව හේතුවෙන් පීඩාවට පත් වන ජන ජීවිතයෙහි යථාර්ථය කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා නූතන සිංහල කෙටිකතාකරුවන් සමත් වී ඇති අයුරු නිරීක්ෂණයට ලක් කිරීම යි.

මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 53%ක් වන අතර, තෝරා ගෙන ඇති ප්‍රතිශතය 43%කි. ලකුණු 11ට වඩා ලබාගත් පිරිස 20%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 31%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 08ට අඩුවෙනි.

**නිගමන හා යෝජනා**

දරිද්‍රතාව නිසා ජන ජීවිතයට ඇති වන පීඩා හා එහි ස්වරූපය නිරූපණය කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරිණි. එහෙත් අපේක්ෂකයන්ට මෙම ප්‍රශ්නය නිරවුල් ව වටහා ගැනීමට නොහැකි වූ බව පෙනේ. කෙටිකතාවේ අන්තර්ගතය මෙන් ම ආකෘතිය කෙරෙහි ද අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරලීම වැදගත් ය. එසේ ම පැරණි හා නූතන ලේඛකයන්ගේ කෙටිකතා කියවීමේ වැදගත්කම පිළිබඳ අපේක්ෂකයන් දැනුවත් කළ යුතු ය. තව ද කෙටිකතා විචාර ආශ්‍රිත ව ලියැවී ඇති ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනය කිරීමට අපේක්ෂකයන් යොමු කරලීම අවශ්‍ය ය.

## 07 ප්‍රශ්නය

**7. ස්වකීය කාව්‍ය අනුභූති වඩා ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීම සඳහා නූතන කවීන් ඉවහල් කොට ගෙන ඇති භාෂාමය උපක්‍රම මොනවා දැයි නූතන පද්‍ය සංග්‍රහයේ ඇතුළත් පද්‍ය පන්ති තුනක්වත් නිදසුන් කොට දක්වමින් පහදන්න.**

(ලකුණු 15 යි.)

නූතන කවීන් සිය කාව්‍ය අනුභූති ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමට ඉවහල් කොට ගෙන ඇති භාෂා උපක්‍රමවල විවිධතා කෙරෙහි අවධානය යොමු කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

එහි දී බොහෝ කවීන් කාව්‍යාලංකාරවලින් පෝෂිත බස් වහරක් යොදා ගෙන තිබෙන ආකාරයක් දක්නට ලැබේ. සංක්ෂිප්තභාවය, ව්‍යංග්‍යාර්ථ, සංකේත, උපමා, රූපක, උත්ප්‍රේක්ෂා, අනුප්‍රාස, එළිසම ආදියෙන් පෝෂිත පද්‍ය පන්ති ලෙස කතරගම, දිවා භෝජනය, පරිණාමා, අන්ධ කවියා, දියණියනි, ලීස්තර වැට ඇතුළු කාව්‍ය නිර්මාණ ගණනාවක් නිදසුන් ලෙස ඉදිරිපත් කළ හැකි ය.

එමෙන් ම සුරාසොඬ සැමිවලප, මිතුරන් දෙදෙනා හා පොරොව, වංකගිරියට මාරුවීම වැනි පද්‍ය පන්ති ඇසුරෙන් ජනකවි බසෙහි ආභාසය ද, පරිණාමා, අන්ධ කවියා වැනි පද්‍ය පන්ති ඇසුරෙන් සුන්දර කවිබසක් නිපදවා ගැනීම උදෙසා රොමැන්ටික් කවියන්ගෙන් ලැබූ ආභාසය ද පිළිතුරට යොදා ගත හැකි ය. මීට අමතර ව චිරන්තන භාෂා යෙදුම් ද එම යෙදුම් හා නූතන කටවහර ද යොදා ගත් ආකාරය පිතෘත්වය, වංකගිරියට මාරුවීම, වවුලු හමුව වැනි පද්‍ය ඇසුරෙන් පෙන්වා දිය හැකි අතර, පරලොවට පණිවිඩයක් වැනි නිර්මාණවල මුළුමනින් ම කටවහර යොදාගත් ආකාරය පිළිබඳ ව අවධානය යොමු කළ හැකි ය. එම කරුණු පදනම් කරගත් නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක්වත් පිළිතුරට යොදා ගෙන තිබිය යුතු ය.

**(ලකුණු 15යි)**

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 61%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 5%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 52%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 23%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 23%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 25%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 62%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

නූතන කවීන්ගේ කාව්‍ය අනුභූති ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීම සඳහා ඉවහල් කොට ගෙන ඇති භාෂා උපක්‍රම මොනවාදැ යි විමසා බැලීම මේ ප්‍රශ්නයේ අරමුණ වේ. මෙහි පහසුතාව මගින් පැහැදිලි වන්නේ සාධන මට්ටම ද මධ්‍යස්ථ ස්වරූපයකින් පවතින බව යි. එසේ වුව ද භාෂා උපක්‍රම කවරේ දැයි විමසීමේ දී කරුණු දැක්වීමේ ප්‍රබල දුර්වලතාවක් දක්නට ලැබිණි. ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 61%කි. ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 23%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 25%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 08ට අඩුවෙනි.

**නිගමන හා යෝජනා**

කවියාගේ අනුභූතින් වඩා ප්‍රබල ව ඉදිරිපත් කිරීමට භාෂාව යොදා ගැනීම විමර්ශනය කිරීම මේ ප්‍රශ්නයේ අභිප්‍රාය වුවත් අපේක්ෂකයන් තුළ ඒ පිළිබඳ ව යථාවබෝධයක් නොමැති වීමෙන් පෙනෙන්නේ ඔවුන් මෙබඳු අංශ ගැන එතරම් අවධානයක් යොමු නොකළ බව යි. පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් පිළිතුරු සැපයීමට අවස්ථාව දීම නිසා අපේක්ෂකයන්ට වඩා පුළුල් සහ විවෘත අවකාශයක් සපයා තිබුණි. එහෙත් අදාළ භාෂාමය උපක්‍රම දැක්වීමේ උගහට බවක් සහ වෙනත් කරුණු මතුවීම බහුල ව දක්නට තිබුණේ ය. එබැවින් මේ කෙරෙහි අවධානය යොමු කිරීමත්, විචාරාත්මක ව කරුණු දැක්වීමත් කෙරෙහි අපේක්ෂකයින් මෙහෙයවීම වඩාත් වැදගත් වේ.

## 08 ප්‍රශ්නය

**8.** **"ජීවිතය සම්බන්ධයෙන් මතු වන අවිනිශ්චිත හා අනපේක්ෂිත අවස්ථාවලට මුහුණ දීම හේතුවෙන් 'රත්නාවලී' නාට්‍යයේ සාගරිකාගේ චරිතය ප්‍රේක්ෂක අවධානයට ලක් වේ." සුදුසු උදාහරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.** (ලකුණු 15 යි.)

- නැව මුහුදුබත් වීම හා තමා වාසවදත්තා බිසව යටතට පත්වීම
- අනංග පූජාවේ දී අහඹු ලෙස රජු දැකීම
- කෙසෙල් උයනේ දී වඳුරාගේ පැමිණීම හා සැළලිහිණියා පියාඹා යාම
- සිතුවම් පුවරුව අමතක වීම
- රජු කෙසෙල් උයනට පැමිණීම
- තුන් වන අංකයේ දී රජු හමුවීම හා වාසවදත්තාට හසුවීම
- අන්තඃපුර ගින්නේ දී නැවත රජු හමුවීම
- සිංහල ඇමතිවරුන් විසින් සාගරිකා හඳුනා ගනු ලැබීම හා වාසවදත්තා බිසව ඇය රජුට භාර දීම
- සිතුවම් පුවරුව දකින රජතුමා කුමන අදහස් පළ කරන්නේ ද යන හැඟීම
- වාසවදත්තා බිසවගේ වෙස් රැගෙන පැමිණෙන තමාගේ රහස දේවිය දැන ගනී ද යන්න සිතන අවස්ථා
- සාගරිකා බිසවගේ අතට හසුව වැල්පොටකින් බැඳ ගෙන යන අවස්ථාව **(ලකුණු 15යි)**

**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 42.37%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 52%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 18%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 18%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 30%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 55%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

රත්නාවලි නාට්‍ය ඇසුරින් සකස් වූ මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කළේ ජීවිතය සම්බන්ධයෙන් මතුවන අවිනිශ්චිත හා අනපේක්ෂිත අවස්ථාවලට මුහුණ දීම හේතුවෙන් සාගරිකාගේ චරිතය ප්‍රේක්ෂක අවධානයට ලක් වූ ආකාරය කවරේ ද යන්න විමර්ශනය කිරීම යි.

මෙහි පහසුතා මට්ටම 55%කි. එය මධ්‍යස්ථ මට්ටමකි. මෙම ප්‍රශ්නය තෝරා ගත් ප්‍රතිශතය 42%කි. ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 18%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 30%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 08ට අඩුවෙනි. ප්‍රශ්නයෙන් අපේක්ෂිත අවිනිශ්චිත හා අනපේක්ෂිත අවස්ථා රත්නාවලි නාට්‍යයේ සාගරිකාගේ චරිතය ඇසුරින් මතුකර දැක්විය හැකි ව තිබුණ ද, ඒ පිළිබඳ ඇතැම් අපේක්ෂකයන් අවධානය යොමු කොට නොතිබූ හෙයින්, ඉහළ පහසුතා මට්ටමක් වෙත ළඟා වීම දුෂ්කර ව ඇත. එහෙත් ඇතැම් අපේක්ෂකයන්ගේ පිළිතුරුවල ඒ සියල්ල මැනවින් අන්තර්ගත වූ බවක් පෙනෙන්නට තිබිණි.

**නිගමන හා යෝජනා**

නාට්‍යයක දී ඒ ඒ චරිත විවිධ අවස්ථාවලට මුහුණ පාන ආකාරය විදහා දැක්වෙයි. රත්නාවලියේ චරිත අවිනිශ්චිත හා අනපේක්ෂිත අවස්ථාවලට බොහෝ විට මුහුණ පායි. එකී චරිත ප්‍රේක්ෂක අවධානයට ලක්වීමට මේ කරුණු හේතු වේ. අපේක්ෂකයන් මෙම අංශය ගැඹුරින් විග්‍රහ කිරීමට දරන උත්සාහය එතරම් සාර්ථක නොවීමෙන් පෙනෙන්නේ ඒ ගැන ඔවුන් දැනුවත් ව නොසිටි ආකාරය යි.

රත්නාවලි නාට්‍යය සංස්කෘත ශෛලිගත නාට්‍ය ශිල්පීය ධර්ම ඇසුරින් නිර්මාණය වී ඇති බව අපේක්ෂකයන්ට අවබෝධ කරවීම කෙරෙහි සැලකිලිමත් විය යුතු ය. නාට්‍ය පෙළ රසවින්දයට ලක් කළ යුතු අතර ම එහි එන චරිත විවිධ අවස්ථාවන්හි දී හැසිරෙන ආකාරය හා එය නාට්‍යයේ විකාශනයට කරන බලපෑම් පිළිබඳ ව ද අපේක්ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු ව ඇත. ප්‍රශ්නයක් නිවැරදි ව අවබෝධ කරගනිමින් ඊට අදාළ ව, විමර්ශනශීලී ව කරුණු ඉදිරිපත් කරමින් පිළිතුරු ලිවීමට අපේක්ෂකයන් පෙලඹවීම ද වැදගත් ය. වෙනත් සංස්කෘත නාට්‍ය, එනම් මැටි කරත්තය බඳු නාට්‍ය අධ්‍යයනය කිරීමේ වැදගත්කම පිළිබඳ ව අපේක්ෂකයන් යොමු කරවීමට ද සැලකිලිමත් විය යුතු ය. සංස්කෘත නාට්‍ය ගැන ලියැවී ඇති ශාස්ත්‍රීය ලිපි ලේඛන අධ්‍යයනයේ වැදගත්කම පිළිබඳ අවබෝධය අපේක්ෂකයන් තුළ ඇති කළ යුතු ය.

2.1.3 **I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**



1 ප්‍රශ්නයේ අනුකොටස් 23 අතුරෙන් 40%කට වඩා අඩු පහසුතා ලබා ඇති අනුකොටස් 5ක් ම ඇත. අනුකොටස් 16ක් පැරණි ගද්‍ය පද්‍ය සාහිත්‍ය අවබෝධය ඇසුරින් සකස් වී ඇති අතර ඉන් 4ක ම පහසුතාව 40%කට අඩු ය. තව ද නිර්දිෂ්ට ග්‍රන්ථ අවස්ථා සම්බන්ධය ඇසුරින් අනුකොටස් 6ක් ඇති අතර එහි සමස්ත පහසුතාව 49%කි. 1 හි (ඏ) කොටස රසාස්වාදය ඇසුරින් සකස් කර ඇති අතර එහි පහසුතාව 58%කි. ප්‍රශ්න අංක 2 සිට 8 දක්වා ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 3ක් සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරින් ද ඉතිරි ප්‍රශ්න 4 නූතන ගද්‍ය පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරින් ද සැකසී ඇති අතර ඒවායේ පහසුතාව 31% සිට 64% අතර විසිරී පවතී.




සමස්ත පහසුතාව සැලකීමේ දී 49%ක් වන අඩු ම පහසුතාව නිර්දිෂ්ට ග්‍රන්ථ අවස්ථා සම්බන්ධය ඇසුරෙන් සැකසූ ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරුවලට ලැබී ඇත. එමෙන් ම 50% වන ඊළඟ පහසුතාව සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරින් සැකසූ ප්‍රශ්නවලට ලැබී ඇත. එබැවින් ඉහත කරුණු කෙරෙහි වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී යොමු කළ යුතු ය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

I කොටස - මෙම කොටසට වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20කි.

II කොටස - අර්ධ ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 7කි. 2 හා 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ 2 හා 3 ප්‍රශ්නවලට ලකුණු 25 බැගින් ද, සෙසු ප්‍රශ්නවලට ලකුණු 15 බැගින් ද ලැබේ.

II පත්‍රය සඳහා මුළු ලකුණු 20 + 80 = 100

## 2.2.2. II ප්‍රශ්න පත්‍රය - I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. 'ච' අක්ෂරය සැලකෙනුයේ කුමන අක්ෂරයක් ලෙස ද?
(1) කණ්ඨජ (2) කණ්ඨ තාලුජ (3) දන්ත ඕෂ්ඨජ (4) තාලුජ (5) මූර්ධජ (……)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) කේශාකර්ෂණය, න්‍යෂ්ටික, ශබ්ධාර්ථ, ඡන්දශ්ශාස්ත්‍රය, දලදඬු
(2) ඡන්දශ්ශාස්ත්‍රය, දළදඬු, ශබ්දාර්ථ, කේශාකර්ශණය, න්‍යෂ්ටික
(3) දළදඬු, ශබ්දාර්ථ, ඡන්දස්ශාස්ත්‍රය, න්‍යෂ්ටික, කේෂාකර්ෂණය
(4) න්‍යෂ්ඨික, ඡන්දස්ශාස්ත්‍රය, කේෂාකර්ශනය, ශබ්දාර්ථ, දළදඬු
(5) ශබ්දාර්ථ, කේශාකර්ෂණය, න්‍යෂ්ටික, ඡන්දශ්ශාස්ත්‍රය, දළදඬු (……)

1.3. **අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
(1) අනුරාධපුරය, අලව්ව, අතුරුගිරිය, අඹේපුස්ස (2) කතරගම, කළුතර, කඩුවෙල, කඳුරුවෙල
(3) මාතර, මාතලේ, මාලිගාතැන්න, මාවතගම (4) වවුනියාව, වඳුරඹ, වලපනේ, වඩමරච්චි
(5) තණමල්විල, තවලම, තලවතුගොඩ, තලාව (……)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) ස්වරයකට අනුව පවතින බැවින් අනුස්වාර නම් වේ.
(2) අනුස්වාරය, වචනයක පවතින ස්වරයකට පූර්වයෙන් ද භාවිත වේ.
(3) ව්‍යඤ්ජනයකට පසුව අතරක් නොතබා ම අනුස්වාරය භාවිත වේ.
(4) 'ං' වර්ගාන්තාක්ෂර ගණයට ඇතුළත් කළ හැකි ය.
(5) අනුස්වාරයට පිල්ලම් එක් කළ හැකි ය. (……)

1.5. **ගයනුකිත්ත, රකාරාංශය, රේඵය** හා **යංශය** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) පෞද්ගලික, දූර්ජන, ක්‍රමික, විද්‍යාව (2) සෞන්දර්ය, ප්‍රබුද්ධ, කණී, ඓක්‍යය
(3) ප්‍රවර්ග, ඌණිරෝම, උපෝෂථ, ධාන්‍ය (4) ඖරසපුත්‍ර, මෞර්ය, අනඝී, වෛද්‍ය
(5) විද්‍යෝදය, ඖදායී, අලෞකික, ප්‍රකට (……)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) දන්තජ අකුරු, මාර්ග නීති, සම්බුදු තෙමඟුල, මහාවංස ටීකාව
(2) ලෝක චාරිත්‍ර, අල්පේච්ඡ දිවිය, සතර දේවාලය, මුවදෙව්දා විවරණය
(3) ජල පවිත්‍රාගාරය, මානුෂීය ආධාර, ජාතික ව්‍යාපාරය, ආයුර්වේද රෝහල
(4) සඳ මඬල, සුර අඹු, කිරිය අදියර, පෙර අඹර
(5) හෘදරෝග ඒකකය, ඒකාබද්ධ විපක්ෂය, පුනර්ජනනීය බලශක්ති, පරිසර ඇමති (……)

1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?
(1) ප්‍රධාන, ආකාර, වානර, මෙහෙණ (2) කර්ම, වස්තු, මත්ස්‍ය, විචාර
(3) අග්නි, භූගත, ලොව, විදේශ, (4) පුස්තක, පමණ, දීර්ඝ, ප්‍රහාරය
(5) වාණිජ, ආගමන, ප්‍රසිද්ධ, පතිවත (……)

1.8. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මිතුරු - සතුරු, පසමිතුරු, අමිත්‍ර, ශත්‍රු (2) මුකුලිත - විකසිත, පිපුණු, මිණිමුතු, පුබුදු
(3) අපවිත්‍ර - නිර්මල, පවිත්‍ර, පිවිතුරු, මලින (4) කම්පිත - නිශ්චල, අකම්පිත, අචල, නොසැලෙන
(5) භාග්‍යය - දුර්භාග්‍යය, අවාසනාව, අභාග්‍යය, කාලකණ්ණිකම (……)

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) අඳුර - අන්ධකාර, තිමිර, කළුවර, සන්ධ්‍යාව (2) දෙවියා - සුර, දිව්‍ය, අමර, දෙව්
(3) මුහුණ - වත, වුවන, වක්ත්‍රය, මුව (4) ඇතා - ගජ, හස්ති, වරණ, ද්විප
(5) සිංහ - මිගිඳ, බාසරු, සිහ, කෙසර (……)

1.10. **කරණ, සබඳ, අදර, කම්** හා **කතු** යන **විභක්ති සමාස** පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) ගල්කැටයම්, වනසත්තු, ගොපල්ලා, සත්ත්වලෝකය, පරපුටු
(2) සත්ත්වලෝකය, වනසත්තු, පරපුටු, ගල්කැටයම්, ගොපල්ලා
(3) ගොපල්ලා, සත්ත්වලෝකය, ගල්කැටයම්, පරපුටු, වනසත්තු
(4) ගල්කැටයම්, සත්ත්වලෝකය, වනසත්තු, ගොපල්ලා, පරපුටු
(5) ගල්කැටයම්, වනසත්තු, සත්ත්වලෝකය, ගොපල්ලා, පරපුටු (……)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.
(1) බැලිලි, කැවිලි, ඇවිලි, පැටලිලි (2) උතුරන, මතුරන, පතුරන, වගුරන
(3) ශ්‍රවණීය, වරණීය, කරණීය, වන්දනීය (4) කපන, කොටන, පෙරන, මිරිකන
(5) නැටු, බටු, වාටු, දුටු (......)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**වඩින මැනවි** මහවෙල මැද වෙරළාන" (ආ) "**ඉඳිමින්** දිය තුළ නො පෙනී බෝ කල"
(ඉ) "**අවුත්** වල වැදි දනන් එතනට" (ඊ) "වරල් විදහා මසුන් **ඉපිලෙත**"
(1) විධික්‍රියා, පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(2) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා
(3) විධික්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(4) මිශ්‍රක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(5) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා (......)

1.13. **අනුක්ත පද දෙකක්** හා **උක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) මුවකු, තෝ, මවක, ඉබ්බෙක් (2) කන්‍යාවක්, සූරයකු, දුවක්, හිඟන්නෙක්
(3) අයෙක්, විද්‍යා චක්‍රවර්තීන්, ගිරවුන්, තාපසයන් (4) විදේශිකයෝ, රීතීහු, මා, ගැරඬියෙක්
(5) පියුම්හු, ධීවරයන්, බිහිරෝ, ගොවීහු (......)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) නිශ්චල, නිදොස්, අවමඟුල, අනුගමන (2) සම්මන්ත්‍රණ, ප්‍රවේගය, සුලකළ, අභිවාදන
(3) දුගඳ, දුලබ, දුසිරිත්, දුම්දූ (4) අබිදම්, උද්ගත, නිර්මල, සුගත
(5) අපවාද, සමාරම්භ, කුදිටු, දුර්වර්ණ (......)

1.15. "**පාඨශාලීය** අධ්‍යාපනයේ ප්‍රගමනය උදෙසා **ගුරුදෙගුරු** දෙපිරිසගේ ම කැපවීම **අත්‍යවශ්‍ය ය**." යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සමාස, තද්ධිත හා සන්ධි (2) සමාස, සන්ධි හා තද්ධිත
(3) සන්ධි, තද්ධිත හා සමාස (4) තද්ධිත, සන්ධි හා සමාස
(5) තද්ධිත, සමාස හා සන්ධි (......)

1.16. **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) ප්‍රභාවත්, කුල්මත්, පාපතර, ජ්‍යෙෂ්ඨතම
(2) වහා, සෙද, නොලසා, සහසා
(3) පොරවනය, අඳනය, ලියනය, පෙරනය
(4) මුත්තණුවෝ, ඇමැත්තාණෝ, දියණියෝ, නෑනණ්ඩියෝ
(5) අත්පා, කඳබඩ, ඇස්කන්, තොලකට (......)

1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.
(1) පාපියුම්, සෑසී, හදවිල, නුවන්මිණ (2) කුරක්කන්පිටි, ඇඹුල්දොඩම්, පිනිජම්බු, බිංකොහොඹ
(3) සුදුල, සුතුර, සුනිල, සුසර (4) තෙමඟුල, පස්ලෝ, දෙලෝ, පසිඳුරන්
(5) තරුඑළිය, නරලොව, ඉබිකටු, රාජසභාව (......)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) ප්‍රත්‍යුපකාර, ජාත්‍යන්ධ, අන්වර්ථ, ලෝකාර්ථ (2) කම්මල, සිත්තම්, සන්නස්, ගෙත්තම්
(3) සුළැඟිල්ල, හොරැහින්, මඟුලැතු, වෙදැදුරු (4) ධනේශ්වර, තපෝධන, මහෝදර, යුද්ධෝපකරණ
(5) දීර්ඝායුෂ, පාලනාධිකාරිය, ක්‍රීඩාංගනය, අත්‍යලංකාර (......)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වාක්‍යය** තෝරන්න.
(1) ලේඛකයා හෝ ලේඛිකාව හෝ පොතක් රචනා කරන්නේ ය.
(2) දරුවෝ හොඳින් උගනිති'යි දෙමවුපියෝ සිතති.
(3) බොහෝ අපරාධකාරයෝ නුගතුන් ය.
(4) දැයට පණ දිය හැකි නායකයෙක් පහළ වේවා!
(5) දරුව, තිරිසනෙක් මෙන් වැඩ නො කරන්න. (......)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) කෞතුකාගාරයකින් ස්ව දේශයේ ප්‍රෞඪත්වය පිළිබඳ මනාඅවබෝධයක් ලදහැකි ය.
(2) තාක්ෂණික උපකරණභාවිතය මිනිසා අකාර්යක්ෂ ම කිරීමට හේතුවේ.
(3) සිංහලභාෂාවර්ධනය හා සම්බන්ධ ප්‍රමුඛත ම කාර්යභාරයක් හෙළහවුලෙන් සිදුවිය.
(4) මවුපියදූදරු සම්බන්ධය ගිලිහීයාම සමාජප්‍රගමනයට අහිතකර වූව කි.
(5) සිංහල සාහිත්‍ය ඥානයෙන් පෝෂණය වූ ප්‍රජාවක් අතීතයෙහි අප රටෙහි විසූහ. (......)

2.2.3 **II** පත්‍රයේ **I** කොටස සඳහා අපේක්ෂිත ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1.1 | 3 |
| 1.2 | 5 |
| 1.3 | 3 |
| 1.4 | 1 |
| 1.5 | 2 |
| 1.6 | 4 |
| 1.7 | 2 |
| 1.8 | 3 |
| 1.9 | 1 |
| 1. 10 | 4 |
| 1. 11 | 5 |
| 1. 12 | 3 |
| 1. 13 | 1 |
| 1. 14 | 3 |
| 1. 15 | 5 |
| 1. 16 | 1 |
| 1. 17 | 3 |
| 1. 18 | 2 |
| 1. 19 | 4 |
| 1. 20 | 5 |

**2.2.4** II ප්‍රශ්න පත්‍රයේ I කොටසට එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | Missing |
| 1.1 | 3 | 9% | 11% | **57%** | 21% | 2% | - |
| 1. 2 | 5 | 4% | 4% | 42% | 15% | **35%** | - |
| 1. 3 | 3 | 8% | 11% | **71%** | 2% | 8% | - |
| 1. 4 | 1 | **46%** | 12% | 22% | 18% | 2% | - |
| 1. 5 | 2 | 1% | **98%** | 0% | 1% | 0% | - |
| 1. 6 | 4 | 9% | 5% | 25% | **24%** | 36% | 1% |
| 1. 7 | 2 | 13% | **34%** | 21% | 17% | 15% | - |
| 1. 8 | 3 | 28% | 23% | **37%** | 8% | 4% | - |
| 1. 9 | 1 | **29%** | 9% | 10% | 38% | 14% | - |
| 1. 10 | 4 | 6% | 18% | 16% | **40%** | 19% | 1% |
| 1. 11 | 5 | 10% | 4% | 15% | 6% | **65%** | |
| 1. 12 | 3 | 6% | 4% | **76%** | 3% | 11% | - |
| 1. 13 | 1 | **64%** | 7% | 3% | 19% | 7% | - |
| 1. 14 | 3 | 4% | 19% | **31%** | 13% | 32% | 1% |
| 1. 15 | 5 | 5% | 7% | 4% | 7% | **77%** | - |
| 1. 16 | 1 | **27%** | 37% | 16% | 13% | 6% | 1% |
| 1. 17 | 3 | 35% | 16% | **28%** | 13% | 7% | 1% |
| 1. 18 | 2 | 5% | **51%** | 21% | 13% | 9% | 1% |
| 1. 19 | 4 | 6% | 19% | 13% | **52%** | 10% | - |
| 1. 20 | 5 | 1% | 1% | 1% | 2% | **95%** | - |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

**2.2.5 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**

බහුවරණ ප්‍රශ්න 20කින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව පිළිබඳ අපේක්‍ෂකයන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ හැකියාව, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්‍ෂිත ය.

මෙම බහුවරණ ප්‍රශ්න 20ට ම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල ප්‍රශ්න පත්‍රයට හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I කොටසේ ප්‍රශ්න 20ට ම පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත් සාමාන්‍යයෙන් පැය භාගයක කාලයක් ඒ සඳහා යෙදීම ප්‍රමාණවත් වේ යැයි අපේක්ෂා කෙරේ.

අංක 8 පිටුවේ ඇති ප්‍රස්තාරයෙහි හා 37 පිටුවේ ඇති වගුවේ දැක්වෙන තොරතුරුවලට අනුව එම ප්‍රශ්න 20 අතුරෙන් පහසුතාව 75% ඉක්මවා පෙන්වන්නේ 1.5, 1.12, 1.15 හා 1.20 ප්‍රශ්නයි. එනම් මෙම පත්‍රයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 75%කට වඩා වැඩි පිරිසකට මෙම ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකි වී තිබේ. එබැවින් එකී ප්‍රශ්න පහසුතම ප්‍රශ්න ලෙස සැලකිය හැකි වේ. එම ප්‍රශ්න අතුරෙන් අංක 1.5 ප්‍රශ්නය වඩාත් පහසු ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 98%ක් වේ. මීළඟට පහසු ප්‍රශ්නය වී ඇත්තේ අංක 1.20යි. එහි පහසුතාව 96%ක් වේ. අනතුරුව 77%ක පහසුතාව ඇත්තේ අංක 1.15 ප්‍රශ්නයට ය.

මෙහිදී අංක 1.5 ප්‍රශ්නයෙන් විමසා ඇති අක්ෂර සංකේත යෙදීමේ අනුපිළිවෙළ ඉතා ඉහළ අපේක්‍ෂකයන් සංඛ්‍යාවකගේ පහසුතාවට ලක්ව ඇත. අංක 1.20 ප්‍රශ්නයෙහි නිවැරදි පද බෙදීම දී ඇති වරණ ඔස්සේ පහසුවෙන් හඳුනා ගැනීමට අපේක්ෂකයන් සමත් වී ඇත. අංක 1.15 ප්‍රශ්නයෙහි ව්‍යාකරණ අංග හඳුනා ගැනීමෙහි ඇති පහසුතාව හේතුවෙන් වැඩි අපේක්‍ෂකයන් පිරිසක් අදාළ පිළිතුර හඳුනා ගත් බව පැහැදිලි වේ.

අංක 1.1, 1.3, 1.11, 1.13, 1.18 හා 1.19 යන ප්‍රශ්නවල පහසුතාව 50% - 75% අතර ප්‍රාන්තරයට අයත් වේ. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්‍ෂ ව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අපේක්‍ෂකයන්ට පහසු වී ඇති බව අනාවරණය වේ. අංක 1.2, 1.4, 1.7, 1.8, 1.10 හා 1.14 යන ප්‍රශ්නවල පහසුතාව 30% - 50% අතර ප්‍රාන්තරයට අයත් වේ.

අංක 1.6, 1.9, 1.16 හා 1.17 යන ප්‍රශ්නවල පහසුතාව 30%ට වඩා අඩුවන බැවින් එම ප්‍රශ්න බොහෝ අපේක්‍ෂකයන්ට නිවැරදි ව පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. ඒ අතුරෙන් වඩාත් ම දුෂ්කර වී ඇති ප්‍රශ්නය වන්නේ අංක 1.6 ප්‍රශ්නය යි. එහි පහසුතාව 24%ක් වේ. එසේ සාධන මට්ටම අඩු වීමට හේතු වී ඇත්තේ අපේක්‍ෂකයන් තුළ තත්සම තද්භව පද එකිනෙකට අනුරූප ලෙස යෙදීම පිළිබඳ ව පැවති අනවබෝධය බව පෙනී යයි.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 පිළිවෙළින් භාෂා කුසලතා, ව්‍යාකරණය, අවබෝධය හා විශ්ලේෂණය යන ප්‍රධාන තේමාවලට යෝග්‍ය ආකාරයෙන් සකස් කර ඇත. භාෂා කුසලතා යටතේ අක්ෂර වින්‍යාසය (1.1, 1.2, 1.4, 1.5), අකාරාදි පිළිවෙළ (1.3), වචන කෝෂය (1.6, 1.7, 1.8 හා 1.9) පද බෙදීම (1.20) යන අංශවලට අදාළ ව ප්‍රශ්න ඉදිරිපත් කෙරේ.

ව්‍යාකරණය යන තේමාව යටතේ 1.10, 1.11, 1.12, 1.13, 1.14, 1.15, 1.16, 1.17, 1.18 හා 1.19 යන ප්‍රශ්න ඇතුළත් කළ හැකි ය. අවබෝධය හා විශ්ලේෂණය මේ සෑම ප්‍රශ්නයක් සමග ම අනුබද්ධ ව පවතී. සෑම ප්‍රශ්නයක් ම යොමු වන්නේ වරණ පහක් යටතේ ය. එම වරණ පහෙන් යෝග්‍ය වරණය තෝරා ගැනීමේ අවබෝධය අපේක්ෂකයන් තුළ තිබිය යුතු ය. විශ්ලේෂණය ද මේ සියලු ප්‍රශ්න සමග බැඳී පවතී. මෙහි දී එක් එක් වරණය විශ්ලේෂණය කරමින් දැනුම හා අවබෝධය උපයෝගි කර ගෙන වඩාත් යෝග්‍ය වරණය තෝරා ගැනීමට අපේක්ෂකයන් යොමු කෙරෙන බව කිව යුතු ය.

සිංහල II පත්‍රයෙහි I කොටසට අයත් බහුවරණ ප්‍රශ්න 20 පහත දැක්වෙන පරිදි ප්‍රධාන තේමා තුනක් යටතේ වර්ගීකරණය කළ හැකි වේ.

- භාෂා කුසලතා - 1.1, 1.2, 1.3, 1.4, 1.5, 1.6, 1.7, 1.8, 1.9, 1.20
- ව්‍යාකරණය - 1.10, 1.11, 1.12, 1.13, 1.14, 1.15, 1.16, 1.17, 1.18, 1.19
- අවබෝධය හා විශ්ලේෂණය - 1.1 සිට 1.20 තෙක් ප්‍රශ්න 20ම

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 10ක් ම ඉදිරිපත් කර තිබුණේ භාෂා කුසලතා තේමාව යටතේ ය. II පත්‍රයට හිමි මුළු ලකුණු ප්‍රමාණයෙන් 10%ක් මෙයට වෙන් වන සේ තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න 20 අතුරෙන් පහසුතම ප්‍රශ්නය අංක 1.5වන අතර එය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 98%කි. මීළඟට මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් අංක 1.20, 96%ක පහසුතාවක් ද, අංක 1.15, 77%ක පහසුතාවක් ද දක්වා ඇත. ඒ අනුව වඩාත් පහසු ප්‍රශ්න තුනෙන් දෙකක් ඇතුළත් ව ඇත්තේ භාෂා කුසලතා තේමාවට ය. ඒ ප්‍රශ්න දෙකෙහි ම පහසුතාව 75% ඉක්මවා ඇත. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් දුෂ්කර බවක් පෙන්වන්නේ අංක 1.6 හා 1.9 ප්‍රශ්න වේ. ඒවායේ පහසුතාව පිළිවෙළින් 24% හා 29% වේ. භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 1.6 ප්‍රශ්නයට අපේක්ෂකයන් දී ඇති පිළිතුරු වඩාත් අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් සිව්වන වරණය තෝරා ඇති අපේක්ෂකයන්ගේ පහසුතාව 24%කි. අපේක්ෂකයන්ගෙන් 9%ක් පළමු වරණය ද, 5%ක් දෙවන වරණය ද, 25%ක් තුන්වන වරණය ද, 36%ක් පස්වන වරණය ද පිළිතුර ලෙස තෝරා ඇත.

අංක 1.6 යටතේ දී ඇති ප්‍රශ්නය වන්නේ 'එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය දී ඇති වරණ අතුරෙන් තෝරා ගැනීම යි''. අනුරූප වචන යුගල හඳුනා ගැනීමට අපේක්ෂකයන්ගේ දැනුම මෙහි දී ප්‍රමාණවත් වී නොමැති බව මින් අනාවරණය වේ.

භාෂාවක් අධ්‍යයනය කිරීමේ දී පොත් පත් සඟරා මෙන් ම ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනයට ගුරුවරුන් යොමු වීම සහ සිසුන්ට අවශ්‍ය මග පෙන්වීම ලබා දීම මෙහි දී වැදගත් වේ. මෙම ප්‍රශ්න දහයෙහි ම පහසුතාව සලකා මධ්‍ය පහසුතාව ගණනය කළ විට භාෂා කුසලතා තේමාවේ සමස්ත කුසලතාව 53%කි.

**ව්‍යාකරණ**

සිංහල II පත්‍රයෙහි I කොටසෙහි ව්‍යාකරණ තේමාව යටතේ ප්‍රශ්න 10ක් අඩංගු වී ඇති අතර මුළු ප්‍රශ්න පත්‍රයේ ලකුණුවලින් 10%ක් එම තේමාවට වෙන් ව තිබේ. එම ප්‍රශ්න 10 අතුරෙන් වැඩි ම පහසුතාව වන 77%ක අගයක් ලබා ගෙන ඇත්තේ අංක 1.15 ප්‍රශ්නය යි. මීට අමතර ව අංක 1.11, 1.12, 1.13, 1.18 හා 1.19 යන ප්‍රශ්න පිළිවෙළින් 66%, 76%, 64%, 51% හා 52% යනා දී වශයෙන් පහසුතා අගයක් පෙන්වා ඇත. ව්‍යාකරණ තේමාව යටතේ අඩු ම පහසුතාවක් පෙන්වා ඇත්තේ 1.16වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 27%කි. මෙම ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර අයත් වන්නේ පළමු වන වරණයට වුවත් එය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 27%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 37%ක් දෙවන වරණය ද, 16%ක් තුන්වන වරණය ද, 13%ක් හතරවන වරණය ද, 6%ක් පස්වන වරණය ද තෝරා ගෙන ඇත.

ව්‍යාකරණ අංග නිවැරදි ව හඳුනා ගැනීම පිළිබඳ ව අපේක්ෂකයන් හට මනා අවබෝධයක් නොමැති වීම මෙහි දී කැපී පෙනේ. මේ අතර එම ප්‍රශ්නය නිරවුල් ව හඳුනා ගත් අපේක්ෂකයන් පිරිසක් ද සිටි බව පැහැදිලි වේ. මෙම ප්‍රශ්න දහයෙහි ම පහසුතාව සලකා මධ්‍යයක පහසුතාව ගණනය කළ විට ව්‍යාකරණ තේමාවේ සමස්ත පහසුතාව 51%කි.

**අවබෝධය හා විශ්ලේෂණය**

සිංහල II පත්‍රයේ I කොටසෙහි ඇතුළත් ප්‍රශ්න 20 ම අවබෝධය හා විශ්ලේෂණය පාදක කොටගෙන ඉදිරිපත් කෙරේ. අපේක්ෂකයන් නිවැරදි වරණය තෝරා ගැනීමේ දී දක්වා ඇති සියලු වරණ විශ්ලේෂණය කොට නිවැරදි වරණය පමණක් තෝරා ගැනීම සඳහා යෝග්‍ය අවබෝධයකින් යුක්ත විය යුතු ය. මේ කරුණු දෙක කෙරෙහි ම අනවධානයෙන් යුක්ත ව වැරදි වරණයක් තෝරා ගත් අවස්ථා කිහිපයක් දක්නට ඇත. අංක 1.2, 1.6, 1.9 හා 1.16 යන ප්‍රශ්න නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. අවබෝධය හා විශ්ලේෂණ හැකියාවෙන් දුර්වල අපේක්ෂකයකුට වුව ද මෙම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමට හැකිව තිබුණි. අපේක්ෂකයන් විසින් භාෂා භාවිතය පිළිබඳ ව ලියැවුණු පොතපත මෙන් ම නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ ද මැනවින් පරිශීලනය කිරීමේ අවශ්‍යතාව මෙහි දී පැහැදිලි වේ.

2.2.6 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ (වර්ගීකරණය අනුව) :




ඉහත වර්ගීකරණය අනුව 50%ට වැඩි පහසුතා ලබා ඇත්තේ අක්ෂර වින්‍යාසය යටතේ ප්‍රශ්න 4න් 2ක් ද, අකාරාදි පිළිවෙළ යටතේ දී ඇති එක ම ප්‍රශ්නය ද, වචන කෝෂය යටතේ දී ඇති එකම ප්‍රශ්නය ද, පද බෙදීම යටතේ දී ඇති එක ම ප්‍රශ්නය ද, පද වර්ගීකරණය යටතේ දී ඇති ප්‍රශ්න 9න් 5ක් ද වාක්‍ය නිර්මාණය යටතේ දී ඇති එකම ප්‍රශ්න ද වේ. වචන කෝෂය යටතේ දී ඇති සියලු ම ප්‍රශ්න 38%ට වඩා අඩු පහසුතා මට්ටමක පවතී.

| වර්ගීකරණය | ප්‍රශ්න සංඛ්‍යාව | පහසුතාව වැඩිම | | පහසුතාව අඩුම | |
|---|---|---|---|---|---|
| | | ප්‍රශ්නය | පහසුතාව | ප්‍රශ්නය | පහසුතාව |
| 1. අක්ෂර වින්‍යාසය | 4 | 1.5 | 98% | 1.2 | 35% |
| 2. අකාරාදි පිළිවෙළ | 1 | 1.3 | 72% | - | - |
| 3. වචන කෝෂය | 4 | 1.8 | 37% | 1.6 | 24% |
| 4. පද බෙදීම | 1 | 1.20 | 96% | - | - |
| 5. පද වර්ගීකරණය | 9 | 1.15 | 77% | 1.16 | 27% |
| 6. වාක්‍ය නිර්මාණය | 1 | 1.19 | 52% | - | - |




II ප්‍රශ්න පත්‍රයේ I කොටසේ වර්ගීකරණය අනුව පහසුතාව ඉහත ප්‍රස්තාරයෙන් නිරූපණය කෙරේ. ඒ අනුව පද බෙදීම යටතේ දී තිබූ එක ම ප්‍රශ්නය සඳහා වැඩි ම පහසුතාවක් ලබා ගෙන ඇත. එය 96%ක් වේ. ඊළඟට වැඩි ම පහසුතාව 72%ක් ලබා ගෙන ඇත්තේ අකාරාදී පිළිවෙළ යටතේ දී තිබූ එක ම ප්‍රශ්නයට ය. සමස්ත පහසුතාව සැලකූ විට අක්ෂර වින්‍යාසය යටතේ දී තිබූ ප්‍රශ්න 4 සඳහා ඊළඟට වැඩි ම පහසුතාව වන 59% හිමි කර ගෙන ඇත. අඩු ම පහසුතාව ලබා ඇත්තේ වචන කෝෂය යටතේ අසා ඇති ප්‍රශ්න 4ට ය. එහි සමස්ත පහසුතාව 31%කි.

**2.2.7 II ප්‍රශ්න පත්‍රයේ II කොටස හා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා :-**

## II කොටස

**02 ප්‍රශ්නය**

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාවේ නිෂ්පාදනය කරන ලද චිත්‍රපටි බොහොමයක් ම රටේ සංස්කෘතික වටිනාකමට අනර්ථකාරී අයුරෙන් බල පා ඇත. ඒවා වෙළෙඳ භාණ්ඩ වශයෙන් සාර්ථක වූ ඉන්දීය චිත්‍රපටිවල හුදු පිටපත් ය. ඒවා භාෂාව කෙලෙසා ප්‍රේක්ෂකයාගේ පහත් ම රුචිකත්වයට තුඩු දෙමින් නිසරු විනෝද ලොවකට පිවිසීමට ඉඩ ලබා දෙයි. දේශීය කලාකරුවනට ඔවුන්ගේ කුසලතා දියුණු කර ගැනීමේ නියම අවස්ථා නො සැලසිණි. එ පමණක් නොව ඔවුන් සතු ඕනෑ ම දක්ෂතාවක් ඉන්දීය ශිල්පීන්ගේ හුදු පිටපත් බවට හැරවීමට සිදු විය.

සමීපස්ථ ඉන්දියාව වැනි විශාල රටක් හා තරගයකට මුහුණ පෑමට සිදු වී තිබෙන හෙයින් ලංකාවේ තුරුණු කලා ද විශිෂ්ට සංස්කෘතිය ද නො නැසී පවත්වා ගැනීමට ලක් රජය විසින් යම් ප්‍රමාණයක ආරක්ෂාවක් සැලසිය යුතු ය. මේ රටේ රුචිකත්වයත් රසිකභාවයත් නොදැනුවත් ව ම, නොකඩව ම විනාශයේ ප්‍රපාතයට යන ගමන වැළැක්විය හැක්කේ එවැනි පියවරකින් පමණි. මෙම දුෂ්කර කටයුත්තේ බරපතළකම සුළු කොට තැකිය නොහේ. අප කැමති වුව ද, නොවුව ද, නිර්දය වේගයෙන් වෙනස් වන නාගරිකත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් කලාව බහුජන සංස්කෘතියත්, සුළු ප්‍රභූ සංස්කෘතියත් වශයෙන් දෙ අන්තයකට යාම නො වැළැක්විය හැකි වනු ඇත. නාගරික සංස්කෘතියේ නිෂ්පාදනයක් වන චිත්‍රපටිය මේ දෙ අන්තයේ ගමනයෙන් වැඩියෙන් ම ආභාසය ලබයි. නවීනතම පර්යේෂණාත්මක සිනමාවත්, නොසැබි සිනමාවත්, මහජන ප්‍රසාදයෙන් ඈත්වීම මීට සාධකයකි.

(i) ලංකාවේ නිෂ්පාදිත චිත්‍රපටි බොහොමයක් රටේ සංස්කෘතික වටිනාකමට අනර්ථකාරී අයුරෙන් බලපෑ බව තහවුරු කෙරෙන නිදසුන් **දෙකක්** දක්වන්න.

(ii) දේශීය කලාකරුවන්ගේ දක්ෂතාවලට මෙහි දී සිදු වූයේ කුමක් ද?

(iii) ලක් රජය කිසියම් ප්‍රමාණයක ආරක්ෂාවක් ලබා දිය යුතු යැයි මේ ලේඛකයා පවසන්නේ කවර කාර්යයක් උදෙසා ද?

(iv) මහජන ප්‍රසාදයෙන් දුරස්ථ වූ චිත්‍රපට වර්ග නම් කරන්න.

(v) චිත්‍රපටිය වැඩියෙන් ආභාසය ලබන අන්ත **දෙක** දක්වන්න.

(ලකුණු 10 යි.)

(i)
- ඉන්දීය චිත්‍රපටවල හුදු පිටපත් වීම
- භාෂාව කෙලෙසමින් ප්‍රේක්ෂකයා නිසරු විනෝද ලොවකට රැගෙන යාම
- දේශීය කලාකරුවනට දක්ෂතා දියුණු කර ගැනීමට අවස්ථාව නැති වීම

(ii) දේශීය ශිල්පීන්ගේ දක්ෂතා ඉන්දීය ශිල්පීන්ගේ හුදු පිටපත් බවට හැරවීම

(iii) ලංකාවේ තුරුණු කලා හා විශිෂ්ට සංස්කෘතිය නො නැසී පවත්වා ගැනීමට

(iv) නවීනතම පර්යේෂණාත්මක සිනමාව හා නොසැබි සිනමාව

(v) බහුජන සංස්කෘතිය හා සුළු ප්‍රභූ සංස්කෘතිය

**(ලකුණු 10යි)**

(ආ) **පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.**

**අධ්‍යාපනයට ගරු කරන එක ම දේශපාලන සහ සමාජ පිළිවෙත නම් ප්‍රජාතන්ත්‍රවාදයයි පවසා ඇත. පුරවැසියන්ගේ යුක්තිගරුක සහ සුපරිචිත සිත්සතන් ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන බැවින් නූගත් ජනතාවක් අතරේ පහළ වන ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන සිතීමට පවා නො හැකි ය. වැඩෙන පරම්පරාවේ සිතුම් පැතුම් නිවැරදි මං ඔස්සේ යොමු කිරීම සඳහා විශේෂයෙන් සැකසුණු අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධනය කිරීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී රටක් සිය ආරක්ෂාව සලසා ගැනීම වැදගති. ප්‍රජාතන්ත්‍රවාදී රටක අධ්‍යාපන ප්‍රතිපදාවේ ප්‍රධාන කාර්යය වනුයේ ශිෂ්‍යයා සමාජයට පා තබන අවධියේ දී එහි සංකීර්ණභාවය අවබෝධ කර ගැනීමට උපකාර වන පරිදි එය සරල ව ද, නිශ්චිත ව ද ඔහුට ඉදිරිපත් කිරීම ය.**

**ප්‍රජාතන්ත්‍රවාදී රටවලට සෑම පෙරමුණකින් ම තර්ජන එල්ල වන ලෝකයක ජීවත් වන අප දරුවනට ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන පිළිවෙළ පමණක් අවබෝධ කර දීම ප්‍රමාණවත් නො වේ. ඊට ඇලුම් කිරීමටත් ඒ ගැන උදම් වීමටත් බැලූ බැල්මට දක්නට ලැබෙන එහි ව්‍යාකූලත්වය තුළින් පෙනෙන උත්කෘෂ්ට ආදර්ශ සහ හරය වටහා ගැනීමටත් අපගේ ගැටලු ලුහුඬින් නිරාකරණය කළත් ඉතා හානිකර, ප්‍රජාතන්ත්‍ර විරෝධී කෙටි මාර්ග අනුගමනය කිරීමෙන් වැළකී සිටීමටත් ඔවුනට ඉගැන්විය යුතු ය. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදී රටක අධ්‍යාපනය ආරම්භයේ පටන් අවසානය දක්වා ම සජීව ක්‍රියාකාරී අත්දැකීම් විය යුතු ය.**

(ලකුණු 15 යි.)

- අධ්‍යාපනයට ගරු කරන එක ම දේශපාලන හා සමාජ පිළිවෙත ප්‍රජාතන්ත්‍රවාදය යැයි පැවසීම
- පුරවැසියන්ගේ යුක්ති ගරුක සහ සුපරිචිත සිත්සතන් ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන හෙයින් නූගත් ජනතාව අතර පහළ වන ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන සිතීමටවත් නොහැකි වීම
- ප්‍රජාතන්ත්‍රවාදී රටක ආරක්ෂාව සැලසීමට ශිෂ්‍ය සමාජයේ සිතුම් පැතුම් නිවැරදි මං ඔස්සේ යොමු කරමින් ඔවුනට සමාජයේ සංකීර්ණත්වය අවබෝධ කර ගැනීමට හැකි වන සේ අධ්‍යාපන ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීම
- ශිෂ්‍ය ප්‍රජාව, ප්‍රජාතන්ත්‍රවාදයට එල්ලවන තර්ජන, ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ආකාරය පමණක් නොව ඊට ඇලුම් කිරීම, එහි උත්කෘෂ්ට ආදර්ශ හා හරය වටහා ගැනීම, ප්‍රජාතන්ත්‍ර විරෝධී කෙටි මාර්ග අනුගමනය කිරීමෙන් වැළකීම
- ප්‍රජාතන්ත්‍රවාදී රටක අධ්‍යාපනය ආරම්භයේ පටන් අවසානය තෙක් සජීව අත්දැකීම් විය යුතු බව

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු 02ක් අඩු වේ. වචන සංඛ්‍යාව 50 - 60 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි වේ නම් ලකුණු 3ක් අඩු වේ.

**සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට - ලකුණු 03යි**

**අක්ෂර වින්‍යාසයට - ලකුණු 04යි**

**අන්තර්ගතයට - ලකුණු 08යි**

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 97%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 0%ක් ද,
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 60%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 18ට වඩා ලබා ගත් පිරිස 60%ක් වන අතර 6%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 13ට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නය (අ), (ආ) යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර (අ) කොටසේ අනුකොටස් පහ සඳහා ද (ආ) කොටස සඳහා ද පහසුතාව 68% ඉක්මවා ඇත.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

කොටස් දෙකකින් සමන්විත මෙම ප්‍රශ්නයේ පළමු කොටසෙන් දී ඇති පාඨය ඇසුරින් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයීම අපේක්ෂා කරන අතර දෙවන කොටසෙන් කිසියම් පාඨයක් දී එය තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවීම අපේක්ෂා කෙරේ.

මෙයින් (අ) කොටසේ අපේක්ෂකයන්ගේ සාධන මට්ටම ඉහළ අගයක් ගෙන තිබූ අතර, ඊට සාපේක්ෂ ව (ආ) කොටසේ සාධන මට්ටම අඩු වී තිබුණි.

දී ඇති පාඨය පහසුවෙන් අවබෝධ කරගෙන අසා ඇති ප්‍රශ්නවලට සාර්ථක ව පිළිතුරු සැපයීමට අපේක්ෂකයින්ට පහසු වී තිබිණි. එනිසා ම එම කොටස් පහේ ම පහසුතා මට්ටම 79% ඉක්මවා තිබුණි. එහෙත් (අ) කොටසේ (ii) අනුකොටසට පිළිතුරු සැපයීම ඉතිරි අනුකොටස් 4ට පිළිතුරු සැපයීම තරම් සාර්ථක නොවූ බව පෙනේ. ඊට හේතුව ලෙස පෙනෙන්නේ නිශ්චිත ව ඉදිරිපත් කෙරෙන ප්‍රශ්නයකට ඍජු පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් කුසලතාවක් දැක්වුව ද ප්‍රශ්නයක් විශ්ලේෂණය කරමින් පිළිතුරු ලිවීමේ දී ඔවුන් දුර්වලතාවක් පෙන්නුම් කරන බවයි.

2 වන ප්‍රශ්නයේ (ආ) කොටසෙහි පහසුතා මට්ටම 69%ක් විය. මෙය සාරාංශ කරණයට අදාළ ප්‍රශ්නයක් වන බැවින් (අ) කොටසට සමාන්තර ව මෙහි අඩු පහසුතාවක් පිළිබිඹු කරයි. මීට හේතු වූ කරුණු ලෙස කරුණු සම්පිණ්ඩනය කර ප්‍රකාශ කිරීමේ දුර්වලතා, අක්ෂර වින්‍යාසය හා විරාම ලක්ෂණ භාවිතය, උක්ත ආඛ්‍යාත සම්බන්ධ රීති පිළිබඳ අපේක්ෂකයන්ගේ අල්ප අවබෝධය මෙන් ම නියමිත වචන ප්‍රමාණය අඩුවීම හා ඉක්ම වීම ආදිය දැක්විය හැකි ය.

**නිගමන හා යෝජනා**

පාඨයක් ඇසුරින් පිළිතුරු සැපයීමේ දී නිශ්චිත පිළිතුරු ඉදිරිපත් කිරීමට මෙන් ම ප්‍රශ්න විශ්ලේෂණය කරමින් කරුණු දැක්වීමට අපේක්ෂකයන් තුළ ප්‍රාගුණ්‍යයක් ඇති කළ යුතු ය. එසේ ම පාඨයෙහි සම්පිණ්ඩනාර්ථයට හානි නොවන පරිදි වචන සංශ්ලේෂණය කර දැක්වීමටත්, භාෂා රීති අනුල්ලංඝනය කිරීමටත් අපේක්ෂකයන් වග බලා ගත යුතු ය.

## 03 ප්‍රශ්නය

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) මනුෂ්‍ය සමාජයේ සුළු ආරවුල් විසඳීම සම්බන්ධයෙන් සමථ මණ්ඩලවල පවත්නා වැදගත්කම
(ii) Wi-Fi අන්තර්ජාල පහසුකම් රටපුරා ව්‍යාප්ත කිරීම හා ඉන් ලැබෙන වාසි-අවාසි
(iii) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන වකුගඩු රෝගය නිවාරණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග
(iv) මෙරට යටිතල පහසුකම් සංවර්ධනය හා ජාත්‍යන්තර ණය
(v) දියුණුවේ වඩාත් යෝග්‍ය මාවත වනුයේ මිනිසා හදා රට සංවර්ධනය කිරීමයි
(vi) අන්තර්ජාතික ඖෂධ මාෆියාව නිසා පීඩනයට පත් වන අසරණ රෝගීන් (ලකුණු 25 යි.)

(i) රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
(ii) එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
(iii) කරුණුවල පැහැදිලි බව
(iv) නිවැරදි අක්ෂර වින්‍යාසය
(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම
(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
(vii) සුදුසු ලෙස ඡේද වෙන් කිරීම
(viii) කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම
(ix) විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

**(ලකුණු 25යි)**

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 92%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 1%ක් ද,
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 15%ක් ද,
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 67%ක් ද,
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 17%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 18ට වඩා ලබා ගත් පිරිස 17%ක් වන අතර 16%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 13ට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයට අනුව දී ඇති රචනා මාතෘකා හයෙන් එකක් තෝරා ගෙන රචනයක් ලිවිය යුතු ව තිබුණු අතර, එයින් (i), (ii), (iii), (iv), (v) යන රචනා මාතෘකා හතර සඳහා 55%කට වැඩි පහසුතා මටටමක් පෙන්නුම් කර ඇති අතර, එයින් (vi) රචනා මාතෘකාව සඳහා 98%ක උපරිම පහසුතා මට්ටමක් පෙන්වා ඇත.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

අපේක්ෂකයන්ගේ පහසුතා මට්ටම මගින් ඉහළ තත්ත්වයක් ගෙන ඇත්තේ (vi) රචනා මාතෘකාව යි. එහි පහසුතාව 98%කි. සෙසු මාතෘකා සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයන්ගේ පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතින ආකාරය නිරූපණය වෙයි. ඒ අතර (i) හා (iv) යන මාතෘකාවල පහසුතාව පිළිවෙළින් 58%ක් හා 56%ක් ද, (ii), (iii) හා (v)හි පහසුතා පිළිවෙළින් 60%ක්, 61%ක් හා 61%ක් ද වේ. මේ අනුව අඩු පහසුතා මට්ටමක් ප්‍රදර්ශනය වන්නේ (i) හා (iv) යන අංක දරන රචනා මාතෘකාවල ය. මෙයින් පෙනී යන්නේ මනුෂ්‍ය සමාජයේ සුළු ආරවුල් විසඳීම සම්බන්ධයෙන් සමථ මණ්ඩල කාර්යභාරය පිළිබඳ ව හා මෙරට යටිතල පහසුකම් සංවර්ධනය හා ජාත්‍යන්තර ණය අතර ඇති සම්බන්ධතා පිළිබඳ ව විභාග අපේක්ෂකයන් තුළ එතරම් අවබෝධයක් නොමැති බව යි. නූතන සමාජ සංස්ථා පිළිබඳ ව හා රටේ සමාජ, ආර්ථික, සංවර්ධන අවස්ථා පිළිබඳ ව අවධානය යොමු වීමේ මඳ බවක් ද මේ තුළින් ගම්‍ය කෙරෙයි.

**නිගමන හා යෝජනා**

මෙම රචනා මාතෘකා නූතන සමාජ තත්ත්ව මැනවින් පාදක කරගත් එහි විවිධ පැතිකඩ නිරූපණය කරන ඒවා වේ. අන්තර්ජාතික ඖෂධ මාෆියාව පිළිබඳ පසුගිය වසර කිහිපය පුරා ම ජනමාධ්‍ය මගින් වැඩි ප්‍රචාරයක් දෙන ලදි. එබැවින් එම රචනයට ඉහළ ම සාධන මට්ටමක් දැක්වීමට අපේක්ෂකයන්ට හැකි විය. නමුත් සමාජයේ සුලභ ව දක්නට ලැබෙන ඇතැම් අංශ පිළිබඳ ව අවධානය මඳ වීමක් රචනා මාතෘකාවල පහසුතා දෙස බැලීමේ දී පෙනී යයි. මේ තත්ත්වය මග හරවා ගැනීමට කාලීන මාතෘකා ඔස්සේ වැඩි වශයෙන් රචනා ලිවීමටත් සඟරා, ප්‍රවෘත්ති පත්‍ර කියවීමටත් විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්තිවලට සවන් දීමටත් අපේක්ෂකයන් යොමු කරවීම සුදුසු ය. ප්‍රකාශන ශක්තියේ දුර්වලතා මග හරවා ගැනීමට විවිධ මාතෘකා ඔස්සේ ලියවී ඇති ගද්‍ය රචනා කියවීමට යොමු කිරීම ද සුදුසු ය.

## 04 ප්‍රශ්නය

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදෙස් තැන් ඇතොත් නිදෙස් කොට** ලියන්න.

(i) ඔවුහු කම්කරුවන් වෙති.
(ii) ග්‍රාමසේවා නිලධාරි තනතුර සඳහා කාන්තාවන් බඳවා ගැනෙති.
(iii) යහපත් මිනිසුන් ලොව ප්‍රබෝධ කරති.
(iv) ජනාධිපතිතුමා ව්‍යවස්ථාදායක සභාවට සභිකයන් පත් කරති.
(v) පියකු බඳු ඇදුරිඳු තම දක්ෂ ශිෂ්‍යයන් අන් වියතුන්ට හඳුන්වා දෙයි. (ලකුණු 05 යි.)

(i) ඔවුහු කම්කරුවෝ වෙති.
(ii) ග්‍රාමසේවා නිලධාරි තනතුර සඳහා කාන්තාවෝ බඳවා ගැනෙති.
(iii) යහපත් මිනිස්සු ලොව ප්‍රබෝධ කරති.
(iv) ජනාධිපතිතුමා ව්‍යවස්ථාදායක සභාවට සභිකයන් පත් කරයි./ තුමූ, තුමාණෝ - පත් කරති
(v) නිවැරදි වාක්‍යයකි. **(ලකුණු 05යි)**

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) දායකයෝ පෙරහැරට ඇතුන් ගෙන්වති.
(ii) මහනාහිමියෝ උපසම්පදා අපේක්ෂකයන් උපසම්පදා කරති.
(iii) ඇමතිතුමා අප පැසසී ය.
(iv) ගුරුවරු දරුවන් යහපතෙහි යෙදවූහ.
(v) නවකතාකරුවෝ විවිධ රචනා ශෛලීන් හඳුන්වා දෙති. (ලකුණු 05 යි.)

(i) දායකයන් විසින් පෙරහැරට ඇත්තු (ඇත්හු) ගෙන්වෙත්/ ගෙන්වෙති, ගෙන්වනු ලැබෙත්/ ලැබෙති/ ලබත්/ ලබති.
(ii) මහනාහිමියන් විසින් උපසම්පදා අපේක්ෂකයෝ උපසම්පදා කරනු ලැබෙත්/ ලැබෙති/ ලබත්/ ලබති, උපසම්පදා කැරෙත්/ කැරෙති/ කෙරෙත්/ කෙරෙති.
(iii) ඇමතිතුමා විසින් අපි පැසසුණෙමු/ පැසසුණුමු, පසසන ලදුමු/ ලද්දෙමු, පසසනු ලැබුවෙමු/ ලැබූමු/ ලැබුණෙමු.
(iv) ගුරුවරුන් විසින් දරුවෝ යහපතෙහි යෙදවුණු/ යෙදවුණෝ ය/ යෙදවුණාහ/ යෙදවුණහ, / යොදවන ලදහ/ ලද්දාහ/ යොදවනු ලැබූහ/ ලැබුවෝ ය/ ලැබුවාහ.
(v) නවකතාකරුවන් විසින් විවිධ රචනා ශෛලීහු හඳුන්වා දෙනු ලබත්/ ලැබෙත්/ ලබති/ ලැබෙති.

**(ලකුණු 05යි)**

(ඉ) **නිවැරදි වාක්‍යයක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) අම්මා ද අක්කා ද මම ද ගමට (ගියෙමි./ගියෙමු.)
(ii) පෙර (දනවතුන්/දනවත්තු) වූ ඔවුහු අද අසරණ ව සිටිති.
(iii) (වෛද්‍යවරුන්/වෛද්‍යවරු) හෙට රෝහලට පැමිණේවි.
(iv) මව එක් පුතකු වෛද්‍යවරයකු (කෙළේ ය./කළා ය.)
(v) (අප/අපි) උනන්දුවෙන් වැඩ කළ යුතු ය. (ලකුණු 05 යි.)

(i) ගියෙමු
(ii) දනවතුන්
(iii) වෛද්‍යවරුන්
(iv) කළා ය
(v) අප **(ලකුණු 05යි)**

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 57%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 10%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 10%ක් වන අතර 66%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.

4 ප්‍රශ්නයේ කොටස්වල පහසුතාව




★ මෙම ප්‍රශ්නය කොටස් තුනකින් ද, අනුකොටස් 15කින් ද යුක්ත වේ. එයින් (අ) කොටස 56%ක පහසුතාවක් පෙන්නුම් කරන අතර, වැඩි ම පහසුතාව වූ 79%ක් පෙන්නුම් කරනුයේ (ඉ) කොටස යි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

කොටස් තුනකින් සමන්විත මෙම ප්‍රශ්නය උක්ත අඛ්‍යාත සම්බන්ධ වාක්‍ය රීති හා කර්තෘකාරක වාක්‍ය, කර්ම කාරකයට පරිවර්තනය කිරීමේ හැකියාව මැන බැලෙන්නකි. එහි (අ) කොටසෙන් දී ඇති වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කිරීමත්, (ආ) කොටසේ කර්තෘකාරක වාක්‍ය කර්ම කාරකයට පරිවර්තනය කිරීමත්, (ඉ) කොටසෙන් නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලිවීමත් අපේක්‍ෂා කෙරේ.

අපේක්‍ෂකයන් පිළිතුරු සැපයීමේ දී (ඉ), (ආ), (අ) කොටස් සඳහා පිළිවෙළින් 79%ක්, 58%ක් හා 56%ක් වශයෙන් පහසුතා මට්ටම් දක්වා ඇත. මෙයින් පැහැදිලි වන්නේ වරහන් තුළින් වචන තෝරා වාක්‍යයක් නිවැරදි ව ලිවීමට අපේක්‍ෂකයන් වැඩි කුසලතාවක් දක්වා ඇති බව යි. ඊට සාපේක්‍ෂ ව වාක්‍ය කර්මකාරකයට හැරවීම හා සදොස් තැන් නිදොස් කිරීමට දක්වන්නේ අඩු සාධන මට්ටමකි.

**නිගමන හා යෝජනා**

සිංහල ව්‍යාකරණයේ ලේඛන රීතිය සම්බන්ධ වැදගත් ම අංගය වන වාක්‍ය රටා නිර්මාණය කිරීමේ දී එහි ඇති සරල මෙන් ම සංකීර්ණ වාක්‍ය රීති පිළිබඳ අපේක්‍ෂකයන් මනාව දැනුවත් කිරීම වැදගත් ය. එසේ ම කර්මකාරක වාක්‍ය රටා රීතිය ද, අපේක්‍ෂකයන්ට නිවැරදි ව අවබෝධ කර දීමට සැලකිලිමත් විය යුතු ය. තව ද ශාස්ත්‍රීය ලිපි ලේඛන කියවීම කෙරෙහි අපේක්‍ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු අතර එමගින් ලේඛන වාක්‍ය රටා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඔවුන් පෙලඹ විය යුතු ය.

## 05 ප්‍රශ්නය

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) **ස්වභාවෝක්තිය** ද කාව්‍යයට චමත්කාරයක් ගෙන දෙයි.

(ii) ඇතැම් සාහිත්‍ය විචාරකයෝ **චිරන්තන** සාහිත්‍ය ග්‍රන්ථ අගය කරති.

(iii) සියලු ආකාර අපරාධ **මූලෝත්පාටනය** කළ යුතු ව ඇත. (ලකුණු 03 යි.)

(i) ස්වභාවය ප්‍රකාශ කිරීම/ ඇති තතු කීම/ පවත්නා ස්වරූපය කීම/ පවත්නා ස්වරූපය ප්‍රකාශ කිරීම

(ii) බොහෝ කාලයකට අයිති/ දීර්ඝ කාලයකට අයිති/ දිගු කලකට අයත්

(iii) මුලින් ම උදුරා දැමීම/ සහමුලින් ම (සම්පූර්ණයෙන් ම) විනාශ කිරීම/ මුලිනුපුටා දැමීම

**(ලකුණු 03යි)**

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) දියගොඩ දෙකෙහි ම ජීවත් වන

(ii) වනයෙහි හටගන්නා ගින්න

(iii) කිරණ දහසක් ඇත්තේ (ලකුණු 03 යි.)

(i) උභයජීවී

(ii) ළැව්ගිනි, දාවාග්නි, දවග්ගි

(iii) සහසකර/ සහස්‍රරශ්මි/ සහස්සරංසි **(ලකුණු 03යි)**

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) පුරාණ ස්මාරක ................................ පුරාවිද්‍යාඥයන්ගේ මූලික කාර්යභාරයකි.
(ii) ඇතැම් ගොඩනැගිලි නිරතුරුව ම ................................ කළ යුතු ව ඇත.
(iii) රජය, මතට ලොල් වූවන් ................................ කරයි.
(iv) අප විදුහලේ .................... උත්සවය නොබෝදා පැවැත්විණි.
(v) බුදු සසුනේ ................................ සඳහා රාජ්‍ය අනුග්‍රහය අත්‍යවශ්‍ය වේ.
(vi) විදුලි බලාගාර නිරන්තරයෙන් ................................ කිරීම බලධාරීන් සතු කාර්යයකි.
(නඩත්තු/ප්‍රතිසංස්කරණය/චිරස්ථිතිය/සංවත්සර/පුනරුත්ථාපනය/සංරක්ෂණය) (ලකුණු 03 යි.)

(i) සංරක්ෂණය
(ii) ප්‍රතිසංස්කරණය
(iii) පුනරුත්ථාපනය
(iv) සංවත්සර
(v) චිරස්ථිතිය
(vi) නඩත්තු

**(ලකුණු 03යි)**

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) **මී** කතුරු විකිණීමට කඩහිමියෝ දැන් දැන් මැළි වෙති.
(ii) සව් **සත** සසර සයුරින් එතෙර වෙත්වා!
(iii) ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය **නා** ගසයි.
(iv) වසු පැටියා කිරි **උර** උරා මවුදෙන වටා ගැවසෙයි.
(v) සමහරු භස්මාවශේෂ දියෙහි **පා** කරති.
(vi) පහන් **තිර** විකිණීමට ඇත. (ලකුණු 06 යි.)

(i) මී (මීයා) පොළොව, සුරා, මිහිරි, මීමා, මීමැස්සා, මීගස, මකරන්ද, මධු, මදජලය, ඊළඟ
(ii) සත (සත්ත්වයා) ඡත්‍රය, කුඩය, ශාස්ත්‍රය, 7 ඉලක්කම, සත (මුදල් ඒකකය), සියය
(iii) නා (නා ගස), නාගයා, ඇතා, ප්‍රධාන, නායක, නාදය, නාමය, නො පැමිණි, නාලා (පූර්ව ක්‍රියා)
(iv) උර (බීමෙහි), ළය, සර්පයා, උරගල, උදරය, කවරය/ කොපුව
(v) පා (පා කිරීමෙහි) ප්‍රාසාදය, පාද, පාපය, කණුව, පාත්‍රය, පාලා (පූර්ව ක්‍රියා), ගෞරවාර්ථයේ ප්‍රත්‍යයයක්, දිව්රීමේ දී යෙදෙන පදයක්
(vi) තිර (වැටි), ස්ථිර, තිරය, තද, කඩතුරාව, රූපවාහිනී ආදියේ චිත්‍රරූප ප්‍රක්ෂේපණය කරන පැතලි මතුපිට

**(ලකුණු 06යි)**

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 38%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 12%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 12%ක් වන අතර 38%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නය කොටස් 4කින් හා අනුකොටස් 18කින් ද යුක්ත වේ. එයින් 88%ක් වූ වැඩි ම පහසුතාවක් දක්වනුයේ (ඉ) කොටස වන අතර, 26%ක් ලබා ගත් (අ) කොටස අඩු ම පහසුතාවක් පෙන්නුම් කරයි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

(අ), (ආ), (ඉ), (ඊ) යන අනුකොටස් හතරක් යටතේ ඉදිරිපත් කෙරෙන මෙම ප්‍රශ්නයේ අරමුණ ලෙස පෙනෙන්නේ භාෂාවේ අර්ථ විභාගය සහ වචන කෝෂ භාවිතය පිළිබඳ අපේක්ෂකයින්ගේ අවබෝධය මැන බැලීම යි.

මෙහි (අ) හා (ඊ) කොටස් යොමු වන්නේ අර්ථ විභාගය කෙරෙහිය. (අ) කොටසෙන් වාක්‍යයක යෙදී ඇති වචනවල අර්ථ විග්‍රහ කිරීම අපේක්ෂිතයි. (ඊ) කොටසෙන් අපේක්ෂා කරන්නේ බහු අර්ථ පදවලින් නිරූපිත අර්ථ විභාග කිරීම සඳහා අපේක්ෂකයන් දක්වන කුසලතා විමර්ශනය කිරීම යි. (ආ) හා (ඉ) යන කොටස් වචන කෝෂය සඳහා යොමු වේ. (ආ) කොටසෙන් යම් යම් යෙදුම් සඳහා යෝග්‍ය තනි පද විමසීමත් (ඉ) කොටසෙන් හිස්තැනට යෝග්‍ය ආකාරයෙන් පද තේරීමත් අපේක්ෂිත යි.

අර්ථ විභාගය යටතේ (අ) කොටසෙහි පහසුතාව 26%කි. එය අඩුම මට්ටමක පවතී. (ඊ) කොටසෙහි පහසුතාව 70%කි. එය අපේක්ෂකයන් හොඳින් පිළිතුරු සැපයූ කොටසක් බව පෙනේ. (ආ) කොටසෙහි පහසුතාව 59%කි. එය මධ්‍යස්ථ මට්ටමක පවතී. (ඉ) කොටසෙහි පහසුතාව 88%කි. එය ඉහළ සාධන මට්ටමක පවතී. මෙම අනුකොටස් සන්සන්දනය කිරීමේ දී (ඉ) හා (ඊ) අනුකොටස්වලට සැපයූ පිළිතුරු සතුටුදායක මට්ටමක පවතී. 'ආ' කොටසෙහි පිළිතුරු මධ්‍යස්ථ මට්ටමක ද (අ) කොටසේ පිළිතුරු අවම මට්ටමක ද පවතී.

**නිගමන හා යෝජනා**

කිසියම් වාක්‍ය පරිසරයක් තුළ යෝග්‍ය ආකාරයෙන් හිස්තැන් පිරවීමට අපේක්ෂකයන් තුළ පරිචයක් පවත්නා බව පෙනේ. එසේ ම බහු අර්ථවත් පද ඒ ඒ අර්ථයට අනුරූපී ව යෙදීම පිළිබඳ ව ද මධ්‍යස්ථ මට්ටමක අවබෝධයක් ඔවුන් සතු ව ඇත. එහෙත් විදග්ධ භාවිතයේ පවත්නා වචනවල අර්ථාවබෝධයත් විවිධ යෙදුම්වලට යෝග්‍ය තනිපද තෝරා ගැනීමත් පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම එතරම් උසස් නොවේ. මේ අනුව යථෝක්ත අංශ දෙක වන (අ), (ආ) ආශ්‍රිත ව පුළුල් දැනුමක් අපේක්ෂකයන්ට ලබා දීම අත්‍යවශ්‍ය කරුණක් බව පෙනී යයි.

## 06 ප්‍රශ්නය

**6. තද කළු අකුරෙන්** දී ඇති පද **කුමන ව්‍යාකරණ අංගයකට හා අනුඅංගයකට අයත් දැයි** දක්වන්න.

(i) **රියඅනතුර නිසා මගියා** මිය ගියේ ය.

(ii) පුරාතන **ගද්‍යකාව්‍ය** ශබ්ද **මාධුර්යයෙන් අනූන** වර්ණනාවන්ගෙන් යුක්ත ය.

(iii) **පෞරාණික** ලේඛන අතර පනාකඩුව තඹ **සන්නස සුවිශේෂ** වූවකි.

(iv) **කොස්දෙල්** මෙන් **ම ඉන්නල** ද ගෙවතුවල වගා කෙරේ.

(v) ඉහළ **නැගී බිඳෙන** රළ පෙළ බලමින් අපි දිය **කඩනය** අසලට ම ගියෙමු. (ලකුණු 15 යි.)

| | | අංගය | අනු අංගය |
|---|---|---|---|
| (i) | රියඅනතුර | සමාස | විභක්ති සමාස |
| | නිසා | නිපාත<br>අව්‍යය | හේත්වර්ථයේ නිපාත<br>නිපාත |
| | මගියා | තද්ධිත<br>ප්‍රත්‍යයාර්ථ නාම<br>විභක්ති | භූතාර්ථයේ/ වූයේය යන අර්ථයේ තද්ධිත<br>ප්‍රථමා විභක්ති/ පෙර විබත |
| (ii) | ගද්‍ය කාව්‍ය | සමාස | විභක්ති සමාස/ විබත් සමස් |
| | මාධුර්යයෙන් | තද්ධිත<br>විභක්ති<br>ප්‍රත්‍යයාර්ථ නාම | භාවාර්ථයේ තද්ධිත<br>කරණ විභක්ති<br>තද්ධිත |
| | අනූන | සමාස<br>අව්‍යය | අව්‍යය සමාස/ අවිය සමස්<br>නිපාත |
| (iii) | පෞරාණික | තද්ධිත<br>ප්‍රත්‍යයාර්ථ නාම | අස්ත්‍යර්ථයේ/ඊට අයත් යන අර්ථයේ තද්ධිත |
| | සන්නස | සන්ධි<br>විභක්ති | පූර්වරූප සන්ධිය/ පෙරරූ සඳ<br>ප්‍රථමා විභක්ති/ පෙර විබත |
| | සුවිශේෂ | සමාස<br>අව්‍යය<br>උපසර්ග | අව්‍යය සමාසය/ අවිය සමස්<br>උපසර්ගය<br>අර්ථය වැඩි කිරීම |
| (iv) | කොස්දෙල් | සමාස | දකාරාර්ථ සමාසය/ ද අරුත් සමස් |
| | ම | නිපාත<br>අව්‍යය | අවධාරණාර්ථයේ නිපාත<br>නිපාත |
| | ඉන්නල | සන්ධි | ද්විත්ව රූප සන්ධිය/ දෙරූ සඳ |
| (v) | නැගී | ක්‍රියා | පූර්ව ක්‍රියා/ පෙර කිරිය / නේපාතික ක්‍රියා/ නෛපාතික ක්‍රියා |
| | බිඳෙන | කෘදන්ත<br>ප්‍රත්‍යයාර්ථ නාම | වර්තමාන කෘදන්ත<br>කෘදන්ත |
| | කඩනය | කෘදන්ත<br>ප්‍රත්‍යයාර්ථ නාම | කරණ කාරක කෘදන්ත<br>කෘදන්ත |

**අංගයට ලකුණු ½ ක් ද අනු අංගයට ½ක් ද ප්‍රදානය කරන්න.**

**(ලකුණු (½ × 6) × 5 = ලකුණු 15යි)**

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 17%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 00 - 03 | ප්‍රාන්තරයේ | 9%ක් ද, |
| ලකුණු | 04 - 07 | ප්‍රාන්තරයේ | 22%ක් ද, |
| ලකුණු | 08 - 11 | ප්‍රාන්තරයේ | 49%ක් ද, |
| ලකුණු | 12 - 15 | ප්‍රාන්තරයේ | 20%ක් ද, |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 20%ක් වන අතර 31%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ පහසුතාව 54%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

6 වන ප්‍රශ්නය සඳහා ලැබී ඇති පහසුතා අගය 54%ක් වන අතර එය මධ්‍යස්ථ මට්ටමකි. එක් එක් ව්‍යාකරණ අංග හා ඒවායේ ප්‍රභේද පිළිබඳ ව අපේක්ෂකයන්ගේ දැනුම මැන බැලෙන මෙම ප්‍රශ්නයේ දී අපේක්ෂකයන් ඉහළ සාධන මට්ටමක් ප්‍රදර්ශනය කරන්නට අපොහොසත් ව ඇත්තේ ව්‍යාකරණ අංග හඳුනා ගැනීමට මෙන් ම ඒවායේ විවිධ ප්‍රභේදතා හඳුනා ගැනීමට ද නිවැරදි අවබෝධයක් නොතිබීම හේතුවෙනි. විශේෂයෙන් ම අනුඅංග හඳුනා ගැනීමට මෙන් ම එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව්‍යාකරණ අංග අනුපිළිවෙළින් ඉදිරිපත් කිරීමට ද ඇතැම් අපේක්ෂකයන් අපොහොසත් වී ඇති බව පෙනේ. එම කරුණු හේතුවෙන් ඔවුන්ගේ සාධන මට්ටම ඉහළ අගයක නො පැවතිණි.

**නිගමන හා යෝජනා**

ව්‍යාකරණ අංග පිළිබඳ ව මනා අවබෝධයක් ඇති අපේක්ෂකයන්ට මෙය ඉතා පහසුවෙන් ලකුණු උපයා ගත හැකි ප්‍රශ්නයක් බව පැහැදිලි වේ. එබැවින් එක් එක් ව්‍යාකරණ අංග නිවැරදි ව හඳුනා ගැනීම අවශ්‍ය වන අතර ම ඒවායේ අනුප්‍රභේද පිළිබඳ අවබෝධය ලබා ගැනීම ද අවශ්‍ය වේ.

මෙම ප්‍රශ්නයේ පහසුතාව ඉහළ මට්ටමකට ගෙන යාමට කළ යුතු වැදගත් ම කාර්යය වන්නේ අපේක්ෂකයන් හැකිතාක් අභ්‍යාසකරණය සඳහා යොමු කරවීම යි. මෙහි දී ප්‍රස්තුත පද විවිධාකාරයෙන් සන්දර්ශනය කොට විග්‍රහ කිරීමේ හැකියාවක් ලබා ගැනීමට අපේක්ෂකයන් උත්සාහ ගත යුතු වේ.

## 07 ප්‍රශ්නය

**7.** (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) **අනුවණකම් කළොත් එයට කළ හැකි පිළියමක් ද නැත**
(ii) **නිසි ඵලප්‍රයෝජන ලබාගත නො හැකි වීම**
(iii) **කෙටි මං තිබිය දී දිගු මගකින් යාම**
(iv) **බලවතුන් සමග තරග කොට ජයගත නො හැකි වීම**
(v) **ලොකු දේ ඇති විට සුළු දේවල් අමතක වීම**
(vi) **තම වස්තුව නැති කරගෙන අනුන්ගේ පිහිට පැතීම** (ලකුණු 03 යි.)

(i) ගිය නුවණ ඇතුන් ලවා වත් අද්දවන්ට බැරුවා වාගේ
(ii) දත නැති දා උක්දඬු ගිනි තපින්ට ද?
ආතාට අටුකොස් දුන්නා වාගේ
බල්ලාට ලෙලි පොල් දුන්නා වාගේ
(iii) පරංගියා කෝට්ටේ ගියා වාගේ
(iv) පිනා එක්ක වනා බැහැ
කළුගලේ ඔළුව ගහ ගන්නවා වාගේ
(v) බත් ඇති දා කොස් තිත්ත වීම
(vi) වත්ත බද්දට දී ඇස්සට දත නියවනවා වාගේ **(ලකුණු $\frac{1}{2} \times 6 = 03$යි)**

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) **ඇස් රතු වෙනවා** (ii) **යටිමඩි ගහනවා**
(iii) **හත වදිනවා** (iv) **මොළ කනවා**
(v) **කසුකුසුව** (vi) **පන්දම් ඇල්ලීම** (ලකුණු 03 යි.)

(i) තද කෝපයක් ඇතිවීම
(ii) වංචා කිරීම
(iii) බලවත් පාඩු සිදුවීම
(iv) අසාධාරණ ලෙස සූරා කෑම
(v) රහස් සාකච්ඡාව
(vi) ලාභ අපේක්ෂාවෙන් ආවතේව කිරීම **(ලකුණු $\frac{1}{2} \times 6 = 03$යි)**

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) **සුන් - බුන්** (ii) **හබල් - බබල්**
(iii) **දියුණු - තියුණු** (iv) **මළ - ඉළවු**
(v) **රොඩු - බොඩු** (vi) **ගසා - බසා** (ලකුණු 03 යි.)

(i) අර්ථයෙන් සමීපවන පද දෙකක් යෙදීම
(ii) පළමු පදය අර්ථවත් ව ද, දෙවෙනි පදය අර්ථ විරහිත ව ද යෙදීම
(iii) එකිනෙකට වෙනස් අරුත් දනවන පද දෙකක් යෙදීම/ මුල් පදයේ අර්ථය දෙවෙනි පදයෙන් තීව්‍ර කිරීම
(iv) අර්ථයෙන් සමාන පද දෙකක් යෙදීම
(v) පළමු පදය අර්ථවත් ව ද, දෙවෙනි පදය අර්ථවිරහිත ව ද යෙදීම
(vi) පළමු පදය අර්ථවත් ව ද, දෙවෙනි පදය අර්ථවිරහිත ව ද යෙදීම **(ලකුණු $\frac{1}{2} \times 6 = 03$යි)**

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| (i) | අට්ටං වෙලා | (ii) | ඉස වැදිය |
| (iii) | දොරන් | (iv) | ඇහැකියි |
| (v) | සකල ගෝටෙ | (vi) | පුනම්මා |

(ලකුණු 03 යි.)

(i) මුලු ගැන්නිලා

(ii) ඉසරදය

(iii) දොරවල්

(iv) පුළුවන්/ පුළුවනි/ හැකියි

(v) කුරුලු කූඩුව/ කුරුලු කැදැල්ල

(vi) පුංචි අම්මා/ කුඩම්මා

**(ලකුණු $\frac{1}{2} \times 6 = 03$යි)**

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

| | | | |
|---|---|---|---|
| (i) | යුෂ්මතා | (ii) | දෙහීය |
| (iii) | යාතිකාව | (iv) | අතුරන්නාව |
| (v) | පිරුවටේ | (vi) | ඉයත්තුව |

(ලකුණු 03 යි.)

(i) නුඹ/ ඔබ/ තෝ/ ඔයා

(ii) දෙවෙනි වර සීසෑම/ දෙවෙනි සීසෑම/ මඩහීය

(iii) යැදීම/ කන්නලව්ව/ යාඥාව

(iv) මාගල/ මා පැදුර

(v) පිරිසිදු සුදුරෙදි/ ඇපිල්ලූ රෙදි

(vi) කාලගුණය

**(ලකුණු $\frac{1}{2} \times 6 = 03$යි)**

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 5%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 00 - 03 | ප්‍රාන්තරයේ | 5%ක් ද, |
| ලකුණු | 04 - 07 | ප්‍රාන්තරයේ | 20%ක් ද, |
| ලකුණු | 08 - 11 | ප්‍රාන්තරයේ | 52%ක් ද, |
| ලකුණු | 12 - 15 | ප්‍රාන්තරයේ | 23%ක් ද, |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 23%ක් වන අතර 25%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




- ⋆ 7 වන ප්‍රශ්නයේ අනුකොටස් අතුරෙන් 36%ක වැඩි ම පහසුතාව (ආ) කොටස සඳහා දක්නට ලැබෙන අතර අඩු ම පහසුතා පෙන්නුම් කරනුයේ 31%ක් ලැබී ඇති (ඉ) සහ (උ) යන කොටස් ය.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

7 වන ප්‍රශ්නයේ දී සියලු අනුකොටස් සැකසී ඇත්තේ භාෂාවේ විශේෂ යෙදුම්, උපභාෂණ හා ප්‍රාස්තාවික ව්‍යවහාර පිළිබඳ අවබෝධය පිරික්සා බැලීමට යි.

මෙහි (අ), (ආ), (ඉ) කොටස් පිළිවෙළින් ප්‍රස්තාව පිරුළු, රූඪී හා යුගල පද සඳහා යොමු වී ඇත. (ඊ) හා (උ) කොටස් ප්‍රාදේශික හා ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා යොමු වී ඇත. මෙම ප්‍රශ්නයේ කොටස් වන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) සඳහා පහසුතාව පිළිවෙළින් 34%ක්, 36%ක්, 31%ක්, 32%ක් හා 31%ක් වශයෙනි. මෙම ප්‍රශ්නයේ කොටස් සියල්ල ම පාහේ අවම පහසුතා මට්ටම් පෙන්නුම් කරයි. (ඉ) සහ (උ) යන කොටස්වලට පාදක වූයේ පිළිවෙළින් යුගල පද සෑදී ඇති රටාව දැක්වීම සහ ප්‍රාස්තාවික ව්‍යාවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලිවීම ය. සාම්ප්‍රදායික යෙදුම් විශේෂයක් ලෙස යුගල පද පිළිබඳ ව අවබෝධයක් විභාග අපේක්ෂකයන් සතු වුව ද ඒවා සෑදී ඇති අයුරු පිළිබඳ අවබෝධයක් ඔවුන් සතු ව නොමැති බව මෙයින් අනාවරණය විය. ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ එන අරුත් දැක්වීමට ද බොහෝ අපේක්ෂකයන් අපොහොසත් වී ඇත. මෙම පද සමාජයේ විවිධ කර්මාන්ත හා ජීවන වෘත්තීන් ආශ්‍රිත ව සකස් වී ඇති ඒවා ය. මේ පිළිබඳ අපේක්ෂකයන් තුළ පැවති දැනුම අල්ප වූ හෙයින් පහසුතා මට්ටම පහළ අගයක් ගෙන ඇති බව කිව හැකි ය. (ඊ) කොටසට ලියූ පිළිතුරුවලට වඩා පහසුතාවක් (අ) කොටසට ලියා ඇති පිළිතුරුවල දක්නට ලැබුණත්, ඒවායේ පහසුතාව ද පිළිවෙළින් 32%ක් හා 34%ක් වේ. ප්‍රාදේශික ව්‍යවහාර හා ප්‍රස්තාව පිරුළු පිළිබඳ දැනුම මැනීම මේවායෙන් අපේක්ෂිත ව තිබිණි. මෙම අනුකොටස් පහෙන් එක කොටසක්වත් 36% පහසුතා සීමාව ඉක්මවා යාමට අපොහොසත් වී ඇත.

**නිගමන හා යෝජනා**

යුගල පද සෑදී ඇති රටා, ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් දැක්වීම, ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දැක්වීම හා ප්‍රස්තාව පිරුළු හා රූඪී හෙවත් ඉඟිවැකි පිළිබඳ ව අපේක්ෂකයන් සැපයූ පිළිතුරුවල පැවති දුර්වලතා හා පහසුතා මට්ටම්වලින් පෙනී යන්නේ මේවා ගැන නිරවුල් දැනුමක් අපේක්ෂකයන් තුළ නොමැති බව යි. එබැවින් යථෝක්ත අංශ පිළිබඳ ව මනා අවබෝධයක් ඇති කර ගැනීම මෙන් ම භාවිතය කෙරෙහි ද අපේක්ෂකයන්ගේ අවධානය යොමු විය යුතු ය. එසේ ම මේ හා බැඳුණු පොතපත පරිශීලනයට ද පියවර ගැනීම සුදුසු ය.

**08 ප්‍රශ්නය**

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඇහැලේපොළමහාදිකාරමශ්‍රීවික්‍රමරාජසිංහරජතුමාගේරාජ්‍යසභාවෙහිසිටිසේනාධිනායකයෙකිප්‍රභුවරයෙකිවංශවතෙකිඔහුගේප්‍රියාම්බිකාවවූඇහැලේපොළකුමාරිහාමිරූමත්යපැහැපත්යචරිතවත්යමේදම්පතීන්ටදරුවෝතිදෙනෙක්වූහඉන්මද්දුමයාපවුලේදෙවෙනිදරුවාමද්දුමබණ්ඩාරනම්වීයඔහුශෞර්යයෙන්මෙන්මධෛර්යයෙන්දසමුපලක්ෂිතයඑසේමසුවචයකීකරුයතවදමනවඩනනියායෙන්හැසිරෙයිපෙම්වඩනනියායෙන්බෙණෙයිඅහෝඛේදයකිමොවුහු සිරිවිකුම් රජසිහනිරිඳුගේඋදහසටලක්වුණුකුඩාදියණියෝමෑණියන්ලවාමවංගෙඩියෙහිලාකොටවනලදහපුතුන්දෙදෙනාගේහිස්ගසාමරාදමනලෙසනියමකැරිණිවධකයාකඩුවරැගෙනඑත්මජ්‍යෙෂ්ඨපුත්‍රයාණෝබියපත්වදුවන්නටවන්හළෙහිඅත් ගසාහඬන්නටවන්හමේදුටුමද්දුමබණ්ඩාරයෝවහාඉදිරියටපැනඅභීතසිංහස්වරයක්විහිදුවාබියනොවන්නඅය්යණ්ඩිමැරෙනාහැටිමමපෙන්වන්නෙමියනුවෙන්පවසාඑම්බාගහලයතාගේඅසිපතින්මාගේබෙල්ලටගසාහිසකඳින්වෙන්කරවයිකියාදංගෙඩියමත්තෙහිහිසතබාලූහදරුවෙනිඔළමොළකම්නොවඑඩිකම්වවවුහීනදීනකම්නොවසුරුවිරුකම්වඩවු

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **අඝෝෂ මහාප්‍රාණ** සහිත පද **දෙකක්** ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii) '**ධීර + ය = ධෛර්ය**' නම්, 'දීන + ය' යන්න කෙසේ සකස් විය යුතු ද?

(iv) '**දරුවා**' යන්නෙහි පිල්ලම් නම් කරන්න.

(v) ඡේදයේ ඇතුළත් නො වන **කොම්බු දෙක** සහ **රකාරාංශය** පිළිවෙළින් යෙදී ඇති පද **දෙකක්** ලියන්න.

(ලකුණු 15 යි.)

(i) ඇහැලේපොළ මහාදිකාරම ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ රාජ්‍ය සභාවෙහි සිටි සේනාධිනායකයෙකි; (සේනාධිනායකයෙකි,) ප්‍රභුවරයෙකි; (ප්‍රභුවරයෙකි,) වංශවතෙකි. ඔහුගේ ප්‍රියාම්බිකාව වූ ඇහැලේපොළ කුමාරිහාමි රූමත් ය; (රූමත් ය,) පැහැපත් ය; (පැහැපත් ය,) චරිතවත් ය. මේ දම්පතීන්ට දරුවෝ තිදෙනෙක් වූහ. ඉන් මද්දුමයා — පවුලේ දෙවෙනි දරුවා — (පවුලේ දෙවෙනි දරුවා) මද්දුම බණ්ඩාර නම් වී ය. ඔහු ශෞර්යයෙන් මෙන් ම ධෛර්යයෙන් ද සමුපලක්ෂිත ය. එසේ ම සුවච ය; (සුවච ය,) කීකරු ය. තව ද මන වඩන නියායෙන් හැසිරෙයි, පෙම් වඩන නියායෙන් බෙණෙයි. අහෝ! ඛේදයකි. මොවුහු සිරි විකුම් රජසිහ නිරිඳුගේ උදහසට ලක් වුණු. කුඩා දියණියෝ මෑණියන් ලවා ම වංගෙඩියෙහි ලා කොටවන ලදහ. පුතුන් දෙදෙනාගේ හිස් ගසා මරා දමන ලෙස නියම කැරිණි. වධකයා කඩුව රැගෙන එත් ම ජ්‍යෙෂ්ඨ පුත්‍රයාණෝ බියපත් ව දුවන්නට වන්හ; (වන්හ,) ළෙහි අත් ගසා හඬන්නට වන්හ. මේ දුටු මද්දුම බණ්ඩාරයෝ වහා ඉදිරියට පැන, අභීත සිංහස්වරයක් විහිදුවා, ''බිය නො වන්න අය්යණ්ඩි, මැරෙනා හැටි මම පෙන්වන්නෙමි'' යනුවෙන් පවසා ''එම්බා ගහලය, තාගේ අසිපතින් මාගේ බෙල්ලට ගසා, හිස කඳින් වෙන් කරව''යි කියා දංගෙඩිය මත්තෙහි හිස තබා ලූහ. දරුවෙනි, ඔළමොළකම් නො ව එඩිකම් වවවු! හීන දීනකම් නො ව සුරුවිරුකම් වඩවු!

**(පද බෙදීමට ලකුණු 03යි)**

**(විරාම ලක්ෂණවලට ලකුණු 04යි)**

(ii) ඛේදයකි, ජ්‍යෙෂ්ඨ

(iii) දෛන්‍ය

(iv) කෙටි පාපිල්ල, ඇලපිල්ල

(v) මෛත්‍රී, වෛශ්‍රවණ, නෛෂ්ක්‍රම්‍ය, ත්‍රෛස්තව, වෛචිත්‍ර්‍ය, ත්‍රෛලෝක, ත්‍රෛකාලික

**(ලකුණු 2 × 4 = 08යි)**

8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 74%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 52%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 18%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 18%ක් වන අතර 30%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




- 8 වන ප්‍රශ්නයේ අනුකොටස් අතුරෙන් 72% වැඩි ම පහසුතාවක් (i) අනුකොටසට ලැබී ඇත. අඩු ම පහසුතාවක් පෙන්නුම් කරනුයේ (iii) වන අනුකොටසට වන අතර එය 32%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

අනුකොටස් 5 කින් සමන්විත මෙම ප්‍රශ්නයේ පළමු අනුකොටසින් පද බෙදා නැති ඡේදයක් විරාම ලක්‍ෂණ භාවිත කොට විධිමත් අයුරින් පද බෙදා වෙන් කර නැවත ලිවීම අපේක්‍ෂා කෙරේ. ඉතිරි අනුකොටස් හතරෙන් භාෂා ව්‍යාකරණ ලක්‍ෂණ කීපයක් පිළිබඳ අපේක්‍ෂකයන්ගේ දැනුම විමසා බැලෙයි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී පළමු අනුකොටසට 72%ක පහසුතා මට්ටමක් දැක්වුව ද, ඊට සාපේක්‍ෂ ව ඉතිරි අනුකොටස්වලට අඩු පහසුතා මට්ටම් පෙන්නුම් කරයි. ඒ අනුව (ii) අනුකොටසට 58%ක් ද, (iii) අනුකොටසට 32%ක් ද, (iv) අනුකොටසට 51%ක් ද, (v) අනුකොටසට 33%ක් ද, දක්වා ඇත.

මෙයින් පැහැදිලි වන්නේ දී ඇති ඡේදය විරාම ලක්‍ෂණ යොදා නැවත පද බෙදා ලිවීමට අපේක්‍ෂකයන් දක්වන කුසලතාවට සාපේක්‍ෂ ව ව්‍යාකරණ අංග පිළිබඳ දක්වන කුසලතාව අඩු බව යි.

**නිගමන හා යෝජනා**

සිංහල ලේඛන සම්ප්‍රදායය හා සම්බන්ධිත විරාම ලක්‍ෂණ භාවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් අපේක්‍ෂකයන්ට ලබා දීමට කටයුතු කිරීම වැදගත් ය.

එසේ ම ලේඛනයේ දී සම්මත ආකාරයෙන් පද බෙදීම පිළිබඳ අවබෝධයක් ද, අක්‍ෂර හා පිලි භාවිතය පිළිබඳ ව මනා අවබෝධයක් ද අපේක්‍ෂකයන්ට තිබිය යුතු ය. මේ සඳහා යෝග්‍ය පොතපත පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ.

2.2.8 II ප්‍රශ්න පත්‍රයේ II කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




II ප්‍රශ්න පත්‍රයේ II කොටසේ ඇතුළත් ප්‍රශ්න අතුරෙන් භාෂා අවබෝධය හා සංශ්ලේෂණය පිළිබඳ ව 2 ප්‍රශ්නය ද, විශ්ලේෂණාත්මක රචනා ලිවීමේ හැකියාව පිළිබඳ ව 3 වන ප්‍රශ්නය ද, දී ඇති අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 77% හා 66% වේ. ඉතිරි ප්‍රශ්න 5 භාෂා විග්‍රහයට ඇතුළත් වන අතර එයින් 7 වන ප්‍රශ්නය 33%ක අවම පහසුතා මට්ටමක් පෙන්නුම් කරයි. ඉතිරි ප්‍රශ්න 4හි පහසුතා මට්ටම් 54%ක් හා 64%ක් අතර පරාසයක පවතී.




වර්ගීකරණය අනුව සමස්ත පහසුතාව සැලකීමේ දී භාෂා අවබෝධය හා සංශ්ලේෂණයට 77%ක් වන ඉහළ ම පහසුතාව ද රචනය හා නිර්මාණකරණ හැකියාවට 66%ක පහසුතාවක් ද භාෂා විග්‍රහය ඇසුරෙන් සැකසී ඇති ප්‍රශ්න සඳහා අඩු ම පහසුතාව වන 54%ක් ද හිමි වී ඇත. විශ්ලේෂණාත්මක රචනා ලිවීමේ හැකියාව සඳහා ඉහළ පහසුතාවක් අපේක්ෂකයන්ගෙන් බලාපොරොත්තු වුවත් 66%ක මධ්‍යස්ථ මට්ටමක් පෙන්නුම් කර තිබිණි. එබැවින් රචනා මාතෘකා කෙරෙහි ඔවුන් තුළ ඇති දැනුම, වචන කෝෂය හා ඉදිරිපත් කිරීම මෙන් ම ගලා යාමේ ස්වරූපය ද කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් කියවීමෙන් කරුණු රැස් කර ගත යුතු බවත් අවධාරණයෙන් සඳහන් කළ යුතු ය.

වර්ගීකරණයට අනුව අඩු ම පහසුතා මට්ටම පෙන්නුම් කරනුයේ භාෂා විග්‍රහයට අදාළ ප්‍රශ්න සඳහා ය. අපේක්ෂකයින්ගේ භාෂා, ව්‍යාකරණ හා වාක්කෝෂ දැනුම පුළුල් කිරීම සඳහා අභ්‍යාසකරණය හා පොතපත පරිශීලනයට හුරු කරවීම අත්‍යවශ්‍ය ය.

## III කොටස

### 3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

### 3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස් :**

* පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු වෙයි. එසේ ම ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති ව ප්‍රශ්න තෝරා ගත යුතු ය.
* I පත්‍රයේ සහ II පත්‍රයේ II කොටසට අයත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන පිළිතුරක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
* II පත්‍රයේ I කොටස ප්‍රශ්න අංකයට ඉදිරියෙන් ඇති වරහන තුළ නිවැරදි වරණයට හිමි අංකය ප්‍රශ්න පත්‍රයේ ම සටහන් කළ යුතු ය.
* ප්‍රශ්න අංක, කොටස් හා අනුකොටස්වල සංකේත නිවැරදි ව ලිවිය යුතු ය.
* ප්‍රශ්නයක කිසියම් අනුකොටසකට පිළිතුරු නොසපයන්නේ නම් එම අනුකොටසට හිමි අක්ෂරය හෝ රෝම ඉලක්කම ලියා ඉදිරියෙන් ඉරක් ඇඳිය යුතු ය.
* අනිවාර්ය ප්‍රශ්න හැරුණු විට අනෙකුත් ප්‍රශ්න එක්වරක් කියවා ඔබ පිළිතුරු ලිවීමට අපේක්ෂිත ප්‍රශ්න මොනවා දැයි ලකුණු කරන්න.
* ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක අනුපිළිවෙළට නො ව ඔබට ඉතා ම හොඳින් පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්නයකින් පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුගත ව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු අතර අමතර ව තවත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන් වැළකිය යුතු ය.
* පිළිතුරු පත්‍රයේ සෑම පිටුවක ම විභාග අංකය සටහන් කළ යුතු ය.
* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී කාලය මනාව කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය.
* පිළිතුරු සැපයීමේ දී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.
* කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු ලිවීමත්, දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලිවීමත් නො කළ යුතු ය.
* දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවල දී තර්කානුකූල ව හා විශ්ලේෂණාත්මක ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

**විශේෂ උපදෙස්**

* I පත්‍රයේ සාහිත්‍ය විචාර ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී උද්ධෘත නිවැරදි ව යෙදීමට සැලකිලිමත් විය යුතු ය.

* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිසි පරිදි කාලය කළමනාකරණයට හුරු විය යුතු ය.

* පැහැදිලි අත් අකුරු ලිවීමටත්, නිවැරදි ලෙස අකුරු යොදා ගැනීමටත් හුරු විය යුතු ය.

* I පත්‍රයට අදාළ සාහිත්‍ය නිදසුන් දැක්වීමේ දී ප්‍රශ්නයට යෝග්‍ය ආකාරයෙන් නිදසුන් තෝරා ගත යුතු ය. එක සමාන නිදසුන් සෑම ප්‍රශ්නයකට ම යෙදීමට උත්සාහ නො කළ යුතු ය.

* II පත්‍රයේ I සහ II කොටස්වල ඇතුළත් ව්‍යාකරණ අනුකොටස්වලට පිළිතුරු සැපයීමේ දී යෝග්‍ය පිළිතුර ම තෝරා ගැනීමට උත්සාහ කළ යුතු ය. මෙහි දී අවබෝධය, දැනුම මෙන් ම තර්කානුකූල චින්තනය ද යොදා ගත හැකි විය යුතු ය.

* තමාගේ හිතුමතය පරිදි යෝග්‍ය යැයි සිතා අංක යෙදීම නො කළ යුතු ය.

* I පත්‍රයේ විචාර ප්‍රශ්නවල දී මෙන් ම II පත්‍රයේ රචනා ප්‍රශ්නයේ දී කරුණු ගැළපීම විධිමත් ව කළ යුතු ය. පිළිතුරෙහි මුල, මැද හා අග අතර විධිමත් ගැළපීමක් පැවතිය යුතු ය.

* ප්‍රශ්නයට අදාළ සෑම කරුණක් ම කිසියම් හේතුවක් නිසා පිළිතුරෙහි ඇතුළත් කිරීමට දුෂ්කරතා ඇති වන අවස්ථාවල දී ලියා ඇති පිළිතුරු මගින් තමන් තුළ පවත්නා දැනුම අනාවරණය කළ යුතු ය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

**අයදුම්කරුවන් සඳහා යෝජනා :**

* විෂය නිර්දේශයට අදාළ පොත්පත් අධ්‍යයනය කිරීමේ දී වැදගත් කරුණු මතකයේ තබා ගැනීමත් ග්‍රන්ථ ආශ්‍රිත කරුණු විචාරාත්මක වශයෙන් විමර්ශනය කිරීමත් අවශ්‍ය වේ.
* නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රයෙන් ඇසිය හැකි ප්‍රශ්න ගැන විචාරාත්මක ව සිතා බලා පිළිතුරු සෙවීමට උත්සාහ ගැනීම අවශ්‍ය ය. මෙහි දී පැරණි ප්‍රශ්න පත්‍ර කියවා ඒවායේ අඩංගු කරුණු විශ්ලේෂණය කිරීම වැදගත් ය.
* නිර්දිෂ්ට ග්‍රන්ථ හොඳින් කියවා ඒවායේ චරිත නිරූපණය, පරිසර හා අවස්ථා වර්ණනා ගැන මනා අවබෝධයක් ලබා ගැනීම සුදුසු ය.

**ගුරුභවතුන් සඳහා යෝජනා :**

* ප්‍රශ්න පත්‍රවල ආකෘතිය පිළිබඳ ව මනා වැටහීමක් අයදුම්කරුවන් තුළ ඇති කිරීම අවශ්‍ය වේ.
* විෂය නිර්දේශයේ සියලු ම කොටස් පිළිබඳ ව මනා පරිචයක් අයදුම්කරුවන් තුළ ඇති කිරීම සුදුසු ය.
* නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයේ අවශ්‍යතාව අයදුම්කරුවන්ට වටහා දී මනා මග පෙන්වීමක් සිදු කිරීම අවශ්‍ය වේ.
* ප්‍රශ්න පත්‍රවල දී ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව හා එම උපදෙස් අබිබවා යෑමෙන් විය හැකි හානි පෙන්වා දීම සුදුසු ය.
* පිළිතුරු ලිවීමේ දී කාලය මනාව කළමනාකරණය කර ගැනීම සඳහා පිළිතුරු ලිවීමේ අභ්‍යාසවල නිරත කරවීම අවශ්‍ය වේ.
* හැකි සෑම විට ම පෙරහුරු පරීක්ෂණවල යොදවමින් විභාගයට මුහුණ දීමේ ශක්තිය අයදුම්කරුවන් තුළ වර්ධනය කිරීම අවශ්‍ය වේ.
* අතිරේක පොත පත කියවීමට සිසුන් ධෛර්යවත් කිරීම සුදුසු ය.
* තර්කානුකූල හා විශ්ලේෂණාත්මක චින්තනයට සිසුන් යොමු කරවීම අවශ්‍ය වේ.
* පොත්පත්වල ඇතුළත් යෝග්‍ය චරිත ශිෂ්‍යයන්ගේ පෞරුෂ වර්ධනයට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරදීම ද අවශ්‍ය වේ.